Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# ගැටුම් ව්‍යාවර්තනය: බහුමානක මෙහෙයුමක්

හියු මියාල් (Hugh Miall)

www.berghof-handbook.net



1. හැඳින්වීම 86

2. ගැටුම් ව්‍යාවර්තන න්‍යායයන් 87

ගැටුම් ව්‍යාවර්තන න්‍යායයක් තිබේද? 87

ගැටුම් ව්‍යාවර්තන න්‍යායයන් සඳහා දායකත්වය 89

ගැටුම් න්‍යායය සිට සන්දර්භීය ගැටුම් න්‍යායය දක්වා 94

3. ගැටුම් නිරාකරණ අභ්‍යාස 101

ගැටුම් ව්‍යාවර්තනයේ ක්‍රියාකාරීහු 101

සම්බන්ධීකරණය සහ බහුපාර්ශ්ව උපායශීලීත්වය / රාජ්‍යතාන්ත්‍රිකත්වය 105

අභ්‍යාසයේ බලපෑම් තක්සේරු කිරීම 107

4. නිගමනය 109

5. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම් 111

©2006 Berghof Research Center for Constructive Conflict **Management**

# ගැටුම් ව්‍යාවර්තනයඃ බහුමානක මෙහෙයුමක්

හියු මියාල් (Hugh Miall)

## 1. හැඳින්වීම

ගැටුම් ව්‍යාවර්තන න්‍යායයේ අතිනවතම සංවර්ධිත තත්ත්වය කුමක්ද? ගැටුම් කළමනාකරණ න්‍යායයක් මේ වන විට තිබේද? එසේ නම් එහි ප්‍රධාන පදනම් කවරේද? අභ්‍යාසකරුවන්ට තම අභ්‍යාසවලදී මඟ පෙන්වීම සම්බන්ධයෙන් මෙම න්‍යායය කෙරෙහි විශ්වාසය තැබිය හැකිද? ගැටුම්වල ගතිකයන් අවබෝධ කර ගැනීම සඳහා සහ මැදිහත්වීම්වල බලපෑම තක්සේරු කර ගැනීම සඳහා විශ්ලේෂකයන්ට මෙය ප්‍රයෝජනයට ගත හැකි ද?

මෙම ලියවිල්ල මඟින් හඳුනා ගැනීමට බලාපොරොත්තු වන්නේ ගැටුම් ව්‍යාවර්තන න්‍යාය සහ අභ්‍යාසය පිළිබඳ කැපී පෙනෙන්නා වූ ලක්ෂණ සහ එහි ප්‍රධානතම මානයන් ය. ගැටුම් විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රමාණවත් පදනමක් ඇති කර ගැනීම මෙන්ම ඒවාට ගැලපෙන ප්‍රතිචාර සැලසුම් කිරීම සහ එම ප්‍රතිචාරයන්ගේ බලපෑම ඇගැයීම සඳහා එවැනි ගැටුම් විපරිවර්තන න්‍යායයක් අපට අවශ්‍ය වේ. මෙම ලියවිල්ල මඟින් තර්ක කරනු ලබන්නේ එවැනි න්‍යායයන් ගැටුම්වල වෙනස්වන ස්වභාවයට ගැලපෙන පරිදි නිරන්තරයෙන් ම සකස් කිරීමේ අවශ්‍යතාව සහ ගැටුම් ගෝලීයකරණය වීම සහ ගැටුම්වලට මැදිහත්වීම් පිළිබඳව යෝග්‍ය පරිදි අවබෝධ කර ගැනීම සඳහා වර්මානයේ පවතින න්‍යායයන් යොදාගත යුතු බව ගැනය.



ලිපියේ පළමු වන කොටසින් ගැටුම් කළමනාකරණ සහ ගැටුම් නිරාකරණ න්‍යායයන් ගැටුම් ව්‍යාවර්තන න්‍යායයෙන් වෙන් කොට හඳුනා ගැනේ. එය සමහර ප්‍රධාන ගැටුම් ව්‍යාවර්තන ප්‍රවේශ වඩාත් විස්තර සහිතව ගවේෂණය කොට ඒවා සංගතික න්‍යායාවලියක් වශයෙන් සැලකිය හැකිදැයි ප්‍රශ්න කරනු ලැබේ. මෙයට පසු එය යෝජනා කරන්නේ *ගැටුම් පිළිබඳ න්‍යායන්හි සිට සන්දර්භීය-ගැටුම්-න්‍යායයන්* දක්වා වූ විස්ථාපනයකි. එසේ තර්ක කරනු ලබන්නේ ගෝලීයකරණ සන්දර්භය තුළ ගැටුම පිළිබඳ අප විශ්ලේෂණ සමාජයීය, කලාපීය සහ ජාත්‍යන්තර තත්ත්වයන්ට යෝග්‍ය පරිදි අවධානයට ලක් කළ යුතු බැවිනි. මේ ආකාර විවිධ තලයන්හි පැතිරී ගිය කාල පරාසයක් තුළ ප්‍රචණ්ඩ ගැටුමක් ආරම්භ වීමට පෙර සිට එය නිරාකරණය වීමෙන් පසුවත් දක්වා සාමය ගොඩනැගීමේ ප්‍රවර්ධනය සහ ගැටුම් උත්සන්න වීම යන කරුණු දෙක ගැනම අපගේ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මෙම පුළුල් පසුතලය තුළ මෙම කොටසින් ප්‍රයත්න දරන්නේ ගල්ටුංගේ සහ අසාර්ගේ ගැටුම් සම්භව න්‍යායයන් ගැටුම් ව්‍යාවර්තන න්‍යායයන් දක්වා විස්තාරණය කොට දැක්වීමටය. එය පස් වැදෑරුම් ගැටුම් ව්‍යාවර්තන රාමු ද යෝජනා කරයි. මේවා ගැටුම් අවස්ථාවල දී මැදිහත්වීම් සැලසුම හා තක්සේරුව සඳහා පදනමක් වශයෙන් ප්‍රයෝජනවත් වනු ඇත.

ලිපියේ දෙවන කොටස සාකච්ඡා කරන්නේ ගැටුම් ව්‍යාවර්තන අභ්‍යාසයේ වර්තමාන සංවර්ධන පිළිබඳවයි. එම සංවර්ධන ප්‍රධාන ආකාරයේ අභ්‍යාස හතරක් තුළ ක්‍රියාත්මක වී ඇති අන්දම

ගෙන හැර දැක් වේ. අභ්‍යාස හතර නම්, රාජ්‍ය සහ අන්තර්-රාජ්‍ය නියෝජිතයින්ගේ අභ්‍යාස, සංවර්ධන නියෝජිතායතනවල අභ්‍යාස, රාජ්‍ය නොවන සංවිධානවල (NGO) අභ්‍යාස සහ ගැටුම් පසුබිම් තුළ දේශීය පාර්ශවයන්ගේ සහ කණ්ඩායම්වල අභ්‍යාසයි. මෙම විවිධ කණ්ඩායම් අතර ඇති මූලප්‍රයත්න සම්බන්ධීකරණයේ දී මුහුණපාන කරුණු ගැන ද සාකච්ඡා කරනු ඇත.

ලිපියේ අවසාන කොටසින් සාකච්ඡා කරන්නේ ගැටුම් ව්‍යාවර්තනය වෙනස්වීම සඳහා විභව්‍යතා සහිත බිජුවටක් සේ සලකමිනි. එකී වෙනස සාම-කාරකයා මෙන්ම ගැටුම්-සමාජය තුළ ද තිබීම අවශ්‍ය වේ.

## 2. ගැටුම් ව්‍යාවර්තන න්‍යායයෝ

### 2.1 ගැටුම් ව්‍යාවර්තන න්‍යායයක් තිබේද?

අවම වශයෙන් ගැටුම් කළමනාකරණ න්‍යායයක් සඳහා අඩිතාලම් දූන් දමා ඇත. එසේ වුවද ක්ෂේත්‍රය තුළ විවිධ චින්තන සහ අභ්‍යාසන පර්ෂදයන් විසින් පුළුල් විවිධත්වයකින් යුත් න්‍යායාත්මක ප්‍රවේශ යොදාගනු ලබන බව ද සත්‍යයකි. මෙම න්‍යායයන් එකිනෙකට වෙනස් රටා සහ විවිධාකාර මැදිහත්කරුවන් (රාජ්‍ය සහ රාජ්‍ය නොවන, අභ්‍යන්තර සහ බාහිර) යන කොටස් දෙකම පිළිබිඹු කරයි. විවිධ කතුවරු සහ අභ්‍යාසකරුවෝ විවිධ ආකාරයෙන් මූලික සංකල්ප සහ යෙදුම් පාවිච්චි කරති. විශේෂයෙන්ම ගැටුම් ව්‍යාවර්තනය යන යෙදුම පුළුල් වශයෙන් ක්ෂේත්‍රය විස්තර කිරීමට යොදන්නේ ද යන වග මෙන්ම ඒ අනුව ගැටුම් ව්‍යාවර්තනය සහ ගැටුම් නිරාකරණය යන යෙදුම් සමානාර්ථ යෙදුම් සේ සැලකිය යුතුද යන්න පැහැදිලි නැත. එසේ නැතහොත් ඒ වෙනුවට ගැටුම් ව්‍යාවර්තනය අනිකුත් ප්‍රවේශ දෙකෙන් වෙන් කොට හඳුනා ගැනීම සඳහා වන විශේෂ සංරචකවලින් සමන්විත වනවාද යන වග ද පැහැදිලි නැත.

මම පසුව සඳහන් කළ කාරණය වෙනුවෙන් කරුණු දක්වමි: ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ පැහැදිලි න්‍යායයක් ඇත්ත වශයෙන්ම ඉස්මතු වෙමින් පවතී. එසේ වුවද මට පෙනෙන තවත් කරුණක් වන්නේ මෙම නව න්‍යාය ආභාසය ලබන්නේ ගැටුම් කළමනාකරණය සහ ගැටුම් නිරාකරණය පිළිබඳ සාමාන්‍ය සංකල්ප තුළින් බවයි. එය රඳා පවතින්නේද ගැටුම පිළිබඳ න්‍යායාත්මක මත පළ කිරීමේ පූර්ව සම්ප්‍රදාය මතම ය. එය වැදගත් වන්නේ සම්පූර්ණයෙන්ම අලුත් ප්‍රවේශයක් වශයෙන් නොව වර්තමානයේ පවතින ගැටුම්වලට වඩාත් උචිත වන පරිදි සැකසීම සඳහා ක්ෂේත්‍රය පිළිබඳ පුනර්සංකල්පීයකරණයක් වශයෙනි.

ගැටුම් ස්වභාවයේ සමහර තීරණාත්මක වෙනස්වීම් එවැනි පුනර් සංකල්පීයකරණයක් ඉල්ලා සිටියි. පළමුවෙන්ම, බොහෝ වර්තමාන ප්‍රචණ්ඩ ගැටුම් අසමමිතික වන අතර, එය බලය සහ තරාතිරම සම්බන්ධ අසමානතා මඟින් සලකුණු කෙරෙයි. දෙවනුව, (මෙම වෙළුමේ තිබෙන ඩෑන් ස්මිත්ගේ ලිපිය බලන්න), සමකාලීන ගැටුම් කලක් තිස්සේ පවතින ඒවා වන අතර, ඒවා වරෙක ප්‍රචණ්ඩ වෙමින් ද, වරෙක ඉන් බැහැර වෙමින් ද පවතිමින් ඒ අනුව, ගැටුම් අවධි පිළිබඳ චක්‍රීය සහ සණ්ඨාකාර ආදර්ශවලට අභියෝග කරයි. තුන්වෙනුව, කාලාන්තරව පවතින ගැටුම් මඟින් සමාජ, ආර්ථික ක්‍රම සහ ඒවා පවතින ප්‍රදේශ හැකිළීමට ලක් කරයි. එතුළින් ව්‍යාකූල හදිසි අවස්ථා ද ඇති වන අතර, මෙම හදිසි අවස්ථා

අවුලවනු ලබන්නේ එක් අතකින් ප්‍රාදේශීය අරගල මගින් හා අනික් අතින් ගෝලීය සාධක වන අවි වෙළෙඳම, සහ පිටස්තර රාජ්‍ය මඟින් පාලන තන්ත්‍ර හා කැරලිකරුවන්ට ආධාර ලබාදීම මඟිනි. මෙම තත්ත්වයන්ගේ සංකීර්ණත්වය ගැටුම් නිරාකරණයේ දී අපට හමුවන මූලික න්‍යායයන්ගේ සාපේක්ෂ සරල බව සමග කැපී පෙනෙන අන්දමින් වෙනස්වෙයි. මෙය විශේෂයෙන් සිදුවන්නේ ද්වි-පාර්ශවීය තරගවල දී දෙපසටම ජය ප්‍රතිඵල පමණක් බලාපොරොත්තු වන අවස්ථාවන්හි දී ය.

මෙම සමස්ත ක්ෂේත්‍රය තුළ වෙනස් වූ ගුරුකුල තුනක් හඳුනා ගැනීම වැදගත් වේ (මෙම වෙළුමේ රෙයිමාන්ගේ ලිපිය බලන්න). ඒ අතරම, ඒවා එකිනෙක සංකලනය වන වැදගත් ප්‍රදේශ ද හඳුනාගත යුතු වේ. ඉහතින් සඳහන් කරුණු තුනම ගැටුම් මැදිහත්වීම් සම්බන්ධයෙන් වෙනස් වූ ප්‍රවේශයන් හුවා දක්වනු පමණක් නොව ගැටුමේ විවිධ සංකල්පීයකරණය ද පිළිබිඹු කරයි.

ප්‍රචණ්ඩ ගැටුම් යනු ජනසමාජ ඇතුළත සහ ඒවා අතර පවතින ඇගයුම් සහ අපේක්ෂා සම්බන්ධ වෙනස්කම්වල මුලිනුපුටා දැමිය නොහැකි ප්‍රතිවිපාකය හැටියට ගැටුම් කළමනාකරණ න්‍යායවාදීහු දකිති. ප්‍රචණ්ඩත්ව නැඹුරුව මතුවන්නේ පවතින ආයතන සහ ඓතිහාසික සම්බන්ධතා තුළින් මෙන් ම ස්ථාපිත බල විස්තෘතිය ද තුළිනි. එවැනි ගැටුම් නිරාකරණය යථාර්ථවාදී නොවන ලෙස ද සැලකේ: කළ හැකි හොඳම දෙය ඒවා කළමනාකරණ කිරීම සහ පාලනය කිරීමත් ඇතැම් අවස්ථාවල දී ප්‍රචණ්ඩත්වය බැහැර කොට ඓතිහාසික සමගි සම්මුතියකට පැමිණ සුපුරුදු දේශපාලන කටයුතු කරගෙන යාමත් ගැටුම් කළමනාකරණය යනු දේශපාලන සමථයක් අත්පත් කර ගැනීම සඳහා උචිත අයුරින් මැදිහත්වීමේ කලාවයි. විශේෂයෙන්ම එය බලය සහ සම්පත්වලින් සමන්විත බලවත් ක්‍රියාකාරීන් විසින් ගැටුමට සම්බන්ධ පාර්ශවයන් මත බලපෑම් ඇති කොට සමථය සඳහා උනන්දු කරවීමයි. නොවැළැක්විය හැකි ගැටුම උචිත මාර්ගවල මෙහෙයවනු සඳහා යෝග්‍ය වූ ආයතන සැලසුම් කිරීමේ කලාව ද එයයි. බ්ලූම්ෆීල්ඩ් සහ රෙයිලිගේ වචනවලින් කියැවෙන පරිදි: *"ගැටුම් කළමනාකරණය යනු ධනාත්මකව හා අර්ථදායී ලෙස විෂමතාව හා විපරීතතාව හැසිරවීමයි. ගැටුම් ඉවත් කිරීම සඳහා විධික්‍රම ඉදිරිපත් කරමින් සිටිනවාට වඩා එය ආමන්ත්‍රණය කරන්නේ වඩාත් යථාර්ථවාදී වූ ගැටුම් කළමනාකරණය පිළිබඳ ප්‍රශ්නයටයි: එය පිළිබඳව අර්ථදායී ආකාරයකින් ක්‍රියා කරන්නේ කෙසේද? සහයෝගී ක්‍රියාවලියක් තුළ ප්‍රතිවිරුද්ධ පාර්ශව එක් තැනකට ගෙන එන්නේ කෙසේද? වෙනස්කම අර්ථදායී ලෙස කළමනාකරණය සඳහා ප්‍රායෝගික, සාක්ෂාත් කරගත හැකි, සහයෝගී ක්‍රමවේදයක් සැලසුම් කරන්නේ කෙසේද? (බ්ලූම් ෆීල්ඩ් සහ රෙයිලි 1998, 18 පිටුව).*

*ගැටුම් නිරාකරණ* න්‍යායයන් ඉදිරිපත් කරන අය අනු මගක් ගනිමින් ගැටුම පිළිබඳ බලදේශපාලන (power politics) මතය ප්‍රතික්ෂේප කරති. ඒ වෙනුවට ඔවුන් තර්ක කරන්නේ වාර්ගික සහ අනන්‍යතා ගැටුම්වල දී ජනතාවට ඔවුන්ගේ මූලික අවශ්‍යතා පාවා නොදිය හැකි බවයි. කෙසේ වුවද තමන්ගේ තරාතිරම් සහ අපේක්ෂා ගවේෂණය කිරීම, විශ්ලේෂණය කිරීම, ප්‍රශ්න කිරීම සහ ප්‍රතිසම්පාදනය සඳහා අදාළ පාර්ශවයන්ට උදව් කළ හැකි නම් ගැටුම් *අතික්‍රමණයට* හැකියාවක් ඇතැයි ඔවුහු තර්ක කරති. ගැටුම් නිරාකරණය ඒ නිසා අවධාරණය කරන්නේ කෘතහස්ත එහෙත් නව චින්තන සහ නව සම්බන්ධතා පෝෂණය කිරීම සඳහා පාර්ශ්වයන් සමග නිල නොවන ආකාරයෙන් කටයුතු කරන, බල රහිත තුන්වන පාර්ශවයන්ගේ මැදිහත්වීමයි. ඔවුන් ගවේෂණය කිරීමට බලාපොරොත්තු

වන්නේ ගැටුමේ සත්‍ය මූල බීජයන් කවරේද යන්න පිළිබඳවත් ඊට පසු තමන් පැළපදියම් වී ඇති ස්ථාවරයන් කෙරේ ඇති බැඳීම හේතු කොට ගෙන පාර්ශවයන්ට අතපසු වී ගිය නිර්මාණාත්මක විසඳුම් පිළිබඳවත් ය. ගැටුම් නිරාකරණය යනුවෙන් අදහස් කරනු ලබන්නේ පාර්ශ්වයන් ගැටුමේ විනාශකාරී රටාවන් ශූන්‍ය-ඵෛක්‍යයේ සිට ධන-ඵෛක්‍යයේ සකාර්යය ප්‍රතිඵල දක්වා තල්ලු කිරීමය. ඉලක්කය වන්නේ "ආරවුලට සම්බන්ධ වී සිටින පාර්ශවයන්ට පිළිගත හැකි බව පෙනෙන සහ ගැටුම් නිරාකරණය සඳහා ඵලදායී විය හැකි ගැටුම් නිරාකරණ ක්‍රියාවලි" වර්ධනය කිරීමයි (අසාර් සහ බර්ටන් 1986, I).

*ගැටුම් ව්‍යාවර්තන* න්‍යායවාදීන් තර්ක කරන්නේ සමකාලීන ගැටුම්වලට හේතුවන භූමිකා නැවත සකස් කිරීම සහ සැමට-ජය ප්‍රතිඵල හඳුනා ගැනීමට වඩා යමක් අවශ්‍ය බවයි. පාර්ශවයන්ගේ සහ සම්බන්ධතාවල සමස්ත ව්‍යූහයම ගැටුමට අදාළ ස්ථානයෙන් ඔබ්බට විහිදී යන්නා වූ ගැටුම්කාරී සම්බන්ධතා රටාවක කා වැදී තිබෙන්නට ඉඩ ඇත. ඒ අනුව ගැටුම් ව්‍යාවර්තනය යනු සම්බන්ධතා, අපේක්ෂා, කතිකා සහ අවශ්‍ය වන්නේ නම් ප්‍රචණ්ඩ ගැටුම් පවත්වාගෙන යාමට සහයෝගය දක්වන සමාජ සංස්ථිතියම අභියෝගයට ලක් කිරීමේ සහ ව්‍යාවර්තනය කිරීමේ ක්‍රියාවලියකි. අර්ථදායී ගැටුම යන්නෙන් අවබෝධ වන්නේ වෙනසක් සඳහා අනිවාර්ය හේතු කාරකයක් හෝ උත්ප්‍රේරකයකි. දීර්ඝකාලීන සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියේ දී ගැටුමට සම්බන්ධ පාර්ශවයන් අතර සිටින උදවිය, සමාජය තුළ සිටින හෝ බලපා ඇති ප්‍රදේශයේ වෙසෙන උදවිය සහ බැහැරින් සිටින අවශ්‍ය මානව සහ භෞතික සම්පත්වලින් යුත් ජනතාව යන සියලු දෙනා විසින්ම ඉටු කළ යුතු අනුපූරක කාර්යභාරයන් ඇත. මෙයින් යෝජනා වන්නේ පරිපූර්ණ සහ පුළුල් පරාසයක පැතිරුණු ප්‍රවේශයකි. මෙහි දී අවධාරණය කරනු ලබන්නේ බාහිර අයවලුන්ගේ මැදිහත්වීමට වඩා ගැටුමට ලක් වී තිබෙන සමාජය තුළ සිටින කණ්ඩායම්වලට උදව් කිරීමයි. කුඩා හෝ මහත් වෙනස්වීම් මාලාවක් ඔස්සේ ගැටුම් ක්‍රමයෙන් ව්‍යාවර්තනය වන බව ද එය පිළිගනී. එමෙන්ම, විවිධාකාර වූ ක්‍රියාකාරීන් විසින් මෙහි දී ඉටු කිරීමට ඉඩ ඇති කාර්යභාරයන් හේතුකොට ගෙන විශේෂිත වූ පියවර මගින් ද එම ව්‍යාවර්තනය සිදුවිය හැකිය. ලෙඩෙරාච් පවසන පරිදි, "ගැටුම් ව්‍යාවර්තනය අදාළ පසුබිම තුළින් මානව සහ සංස්කෘතික සම්පත් පිළිබඳ සක්‍රීය ආකාරයෙන් අවබෝධයක් ලබාගැනීම, ඇතුළත් කර ගැනිම, ගරු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කළ යුතු වේ. මේ සඳහා අලුතින් කාච කට්ටලයක් ලබාගත යුතු අතර, ඒ තුළින් අප මූලික වශයෙන් එහි තිබෙන පසුබිම සහ සිටින ජනතාව 'ප්‍රශ්නයක්' වශයෙනුත් බාහිර තැනැත්තා 'පිළිතුර' වශයෙනුත් 'බලනු' සුදුසු නොවේ. ඒ වෙනුවට අප වටහාගනු ලබන්නේ ව්‍යාවර්තනය පිළිබඳ දීර්ඝ කාලීන ඉලක්කය අදාළ පසුබිමෙහි ජනතාව සහ සම්පත් තුළ තහවුරු කිරීමක් සහ ගොඩනැගීමක් ලෙසය" (ලෙඩෙරාච් 1995).

## 2.2. ගැටුම් ව්‍යාවර්තන න්‍යායයන් සඳහා දායකත්වය

ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ න්‍යායවාදීහු විවිධාකාර වූ සංකල්පීය මූලික කරුණු තුළින් පෝෂණය ලබති. ඒවායින් සමහරක් අලුත්ය, සමහරක් පැරණිය, තවත් සමහරක් වෙනත් ගුරු කුලවලින් ණයට ගත් ඒවාය. ගැටුම් ආකෘති විශ්ලේෂණය කළ යුරෝපීය ව්‍යූහවාදී න්‍යායවාදීන්ගේ ලියකියවිලිවල ගැටුම් නිර්මාණය පිළිබඳ මතය ඒ වන විටත් පැවතුණි (උදාහරණ සෙන්හාස් 1973, ක්‍රිපෙන්ඩෝෆ් 1973). සමහරවිට අද දක්වාම වඩාත්ම බලපෑමක් සහිත ලේඛන වන්නේ හරවත් මූලික සංකල්ප මතු කරන්නා වූ ගල්ටුංගේ නිපැයුමයි (ගල්ටුං 1996, 70-126).

ගැටුම් තුළ ජීවිත-දාන මෙන්ම ජීවිත-නාශන අංගය ද තිබෙන බව ගල්ටුං යෝජනා කරයි. සමාජ ව්‍යූහයේ පරස්පර විරෝධතා තුළින් ඒවා සෑදේ. එවිට ඒවා ආකල්ප සහ චර්යා තුළින් ප්‍රාදුර්භූත වෙයි. නිර්මාණය වූ පසු ගැටුම් විවිධාකාර වූ ව්‍යාවර්තන ක්‍රියාවලිවලට භාජනය වෙයි: ප්‍රකටීකරණය හෝ අප්‍රකටීකරණය උද්යෝගීකරණය හෝ අනුද්යෝගිකරණය, සංකීර්ණකරණය හෝ සරලීකරණය, ධ්‍රැවි-කරණය (polarisation) හෝ නිර්ධ්‍රැවිකරණය (de-polarisation), උත්සන්නීකරණය හෝ නිරුත්සන්නීකරණය මෙම ක්‍රියාවලි වන්නේය (1996, 90). පාර්ශවයන් අතර මතුවන අනනුරූපතා බැහැර කළ හැක්කේ පරස්පර විරෝධතාව අභිබවා යාමෙන්, සමගි සම්මුතිය මගින්, ගැටුම් ව්‍යූහය තියුණු කරමින් හෝ පුළුල් කරමින් සහ ක්‍රියාකාරීන් සම්බන්ධ කර ගැනීමෙන් හෝ බැහැර කිරීම මගිනි (1996, 116). ගල්ටුං, ක්‍රිපෙන්ඩෝෆ් සහ වෙනත් අය අවධාරණය කරන්නේද විශ්ව සමාජ ව්‍යූහය සහ විශ්ව ආර්ථික ව්‍යූහය තුළ ගැබ් වී තිබෙන ගැටුම් සහ මහා පරිමාණ ගැටුම් අතර තිබෙන සම්බන්ධතාවයි.

කර්ලිගේ ලියවිලි ගොඩනගා ඇත්තේ ගල්ටුංගේ ප්‍රවේශය මතය. අසමතුලිත සම්බන්ධතාවල සිට තුලිත තත්ත්වයට මාරුවීම තුළින් අසමමිතික සම්බන්ධතා ව්‍යාවර්තනය කළ හැක්කේ කෙසේද යන්න ඔහු විමසා බලයි. මෙය සාක්ෂාත් කරගනු ලබන්නේ උද්යෝගීකරණය, එදිරිව මුහුණදීම, සාකච්ඡා කිරීම සහ සංවර්ධනය වැනි ක්‍රියාවලියක් තුළිනි. ප්‍රැන්සිස් කළ ආකාරයට ලෙඩෙරාච්, කර්ලිගේ අදහස් පිළිගෙන මෙම අත්පොතට දායකවෙමින් ඇගේ එම අදහස් සංවර්ධනය කළාය. අවිහිංසාවාදය පිළිබඳ න්‍යායාචාරීන්ගේ දායකත්වය ද වැදගත් වී තිබේ (ෂාප් 1973, වෙහර්, බර්ගස් සහ බර්ගස් 1994, ක්ලාක් 2000). අවිහිංසාවාදී ව්‍යාපාරයට ගැටුම් ව්‍යාවර්තනය කළ හැක්කේ ගැටුම රඳවා තබාගෙන සිටින ආධාරක සේ සැලකිය හැකි, ඉඩම් ප්‍රතිසංස්කරණයට එරෙහිවන කණ්ඩායම් වැනි එරෙහි කණ්ඩායම් ඉන් බැහැර කොට ගෙන සමාජයීය විකල්පයන්ට ආධාර කිරීම සඳහා ඔවුන් ඇඳා ගැනීමෙනි (ඉන්ටර්නැෂනල් ඇලර්ට් 1996, 22, 31-33).



සමකාලීන ගැටුම්වල දිග්ගැස්සෙන ස්වභාවයට හේතු දක්වමින් දිග්ගැස්සෙන සමාජයීය ගැටුම් පිළිබඳ අසාර්ගේ ලියවිලි ද ගැටුම් ව්‍යාවර්තන න්‍යායය කෙරෙහි වැදගත් බලපෑමක් ඇති කළේය. ඔහු යෝජනා කරන්නේ දුර්වල රාජ්‍යයන්හි පවතින සමකාලීන ගැටුම්වල ගතිලක්ෂණයන්ට වඩාත් යෝග්‍ය පරිදි ගැලපෙන ප්‍රවේශයකි. ඔහුගේ ලියවිලි කේන්ද්‍රීය කරගනු ලබන්නේ දිග්ගැස්සෙන ගැටුම්වල ප්‍රභවය සහ පැවැත්මයි. ඔහුගේ න්‍යායය වර්ධනය කොට ගෙන එය ගැටුම් ව්‍යාවර්තන න්‍යායයක් වශයෙන් පාවිච්චි කළ හැකිය.

පළමුවන රූප සටහන උපුටා ගෙන ඇත්තේ දිග්ගැස්සෙන්නා වූ සමාජයීය ගැටුම් පිළිබඳ අසාර්ගේ ආදර්ශයෙනි. එය මෙහි දී සමහර වෙනස් කිරීම් සහිතව ප්‍රසාරණය කර ඇත්තේ අසාර්ගේ ආදර්ශය මේ ආකාරයේ ගැටුමක නිර්මාණය සහ ව්‍යාවර්තනය (හෝ විකෘතිකරණය) යන දෙකම ග්‍රහණය කර ගැනීම සඳහා භාවිත කිරීමට හැකි බව පැහැදිලි කිරීම සඳහාය.

අසාර්ගේ කෘතියේ එන රූප සටහන වමේ සිට දකුණට කියවීමේ දී දිග්ගැස්සෙන ගැටුමක හැඩගැසීම කෙනෙකුට පිරික්සා සොයාගත හැකිය. එය මතු වන්නේ ඓතිහාසික සන්දර්භයක් තුළින් සහ මූලික මානව අවශ්‍යතාවන් වන ප්‍රවේශන බලය, අනන්‍යතාව සහ සුරක්ෂිතතාව ලබා නොදීම


මෙන්ම රාජ්‍ය, ජාත්‍යන්තර දේශපාලන සහ ආර්ථික බැඳීම් සහ දේශපාලනයේ මිලිටරි බලය සතු කාර්යභාර තුළිනි. රාජ්‍යය සහ ජන කණ්ඩායම් සිය ක්‍රමෝපාය හැටියට පීඩනය සහ ප්‍රචණ්ඩ කැරලි ගැසීම් තෝරා ගන්නේ නම්, ගැටුම විනාශකාරී වන්නට ඉඩ තිබේ. එය දකුණු කොණේ සිට වමට කියවන විට විනාශකාරී ගැටුම එවිට ගෙන දෙන ප්‍රතිඵලය වන්නේ වඩාත් පරායත්ත හා සූරාකන රටාවකින් යුත් සංවර්ධනයක්, විකෘත වූ පාලන රටාවක් හා යුදකාමී දේශපාලනයක් බිහිවීමය. මෙය තවදුරටත් මූලික අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීමක් කරා දිවෙන්නකි. ප්‍රතිඵලය වන්නේ ආයතනික විකෘතිකරණය සහ විනාශකාරී ගැටුමක දිග්ගැස්සුණු චක්‍රයක් ඇතිවීමයි.

අනික් අතට, පාලනය සහ සමාජය තුළ සෑහෙන ධාරිතාවක් තිබේ නම්, දේශපාලනය එතරම් යුදකාමී නොවේනම් ජාත්‍යන්තර වටපිටාව උදව් දෙන තත්ත්වයක සිටීනම්, රාජ්‍යයන් පීඩනය ආදිය වෙනුවට සහයෝගය දීම ද ප්‍රජා කණ්ඩායම් දේශපාලන මාර්ග තුළින් එදිරිව මුහුණදීම ද තෝරාගැන්මට ඉඩ ඇත. මෙය අර්ථදායී ගැටුම් රටාවක් බවට පත්වීමට ඉඩ ඇති අතර, එය ඒ හේතු කොට ගෙන නීත්‍යනුකූල තීරණ ගැනීමේ ධාරිතාවක් ප්‍රවර්ධනයවීම, ස්වාධීන සංවර්ධනය ශක්තිමත් වීම සහ මිලිටරි දේශපාලනය වෙනුවට සිවිල් දේශපාලනයක් පවත්වාගෙන යාම දක්වා දිවෙනු ඇත. මූලික අවශ්‍යතා සපුරා ගැනීමට මේ සියල්ල හිතකර වේ. සාමාන්‍ය ව්‍යුහාත්මක සහ චර්යාමය පැහැදිලි කිරීම්වලින් ඔබ්බට ගොස් මෙම ආකෘතිය තවදුරටත් හඟවන්නේ ගැටුම් රටාවන් මානව අවශ්‍යතා තෘප්තිමත් කිරීම සඳහා අන්‍යෝන්‍යව ක්‍රියා කරන්නේ කෙසේද, දේශපාලන සහ ආර්ථික ආයතනවල ප්‍රමාණවත් බව සහ දේශපාලන ක්‍රියාකාරීන් විසින් කෙරෙන තෝරාගැනීම් කවරේද යන වගයි. එය හඟවන තවත් කාරණයක් වන්නේ විවිධ විකල්ප ගැටුම හිතකර හෝ අහිතකර ආවර්තනීය තත්ත්වයන් කරා මෙහෙයවන ආකාරයයි.

සමථය කිරීමකට වඩා ව්‍යාවර්තනය කිරීමේ අදහස පදනම් කරගත් ගැටුම් න්‍යායයක් සඳහා වෙරිනෙන් තර්ක කරයි. එහි දී ඔහු අවධාරණය කරනුයේ ගතික පිළිගැනීම් මත ගැටුම් ව්‍යාවර්තනය වන්නේ කෙසේද යන්න වටහා ගැනීම වැදගත් වන බවයි:

*ගැටුම් න්‍යායයේ වැඩි කොටසකින් සැලකෙනුයේ, ගැටලු, ක්‍රියාකාරීන් සහ අපේක්ෂා නිශ්චිත සේ වන අතර එම පදනම මත පිහිටා ඒවා අතර ඇති පරස්පරතාවන් සමනය කිරීමට හෝ ඉවත් කිරීමට විසඳුමක් සෙවීම සඳහා ප්‍රයත්නයන් ගන්නා බවයි. එසේ වුවත් උද්ගත කාරණා, ක්‍රියාකාරීන් සහ අපේක්ෂා සමාජයේ සමාජයීය, ආර්ථික සහ දේශපාලන ගතිකයන් හේතු කොට ගෙනකාලයත් සමග වෙනස් වෙයි (වෙරිනේන් 1991).*

රූපය 01 : දිග්ගැස්සුනා වූ සමාජ ගැටුම් ව්‍යාවර්නය (උපුටා ගැනීම අසාර් - 1990)






ඔහුගේ ප්‍රවේශය මූලික වශයෙන්ම විශ්ලේෂණාත්මක සහ න්‍යායාත්මක වෙයි. නමුත් එයින් සාමය ගොඩනගන්නන් විසින් සැලකිල්ලට ගත යුතු මැදිහත්වීම් ක්‍රම පිළිබඳ ඇගැයීමක් ද යෝජිතය (වෙයිරිනෙන් 1991 බලන්න).

- ක්‍රියාකාරීන්ගේ ව්‍යාවර්තන-පාර්ශ්ව තුළ අභ්‍යන්තර වෙනස්වීම් හෝ නව පාර්ශ්ව මතුවීම;
- උද්ගත කරුණුවල ව්‍යාවර්තන-ගැටුම් උද්ගතකරණ පිළිබඳ න්‍යාය පත්‍රයේ වෙනස්කම් ඇති කිරීම;
- නීති ව්‍යාවර්තන-ගැටුමක් පාලනය කරනු ලබන ප්‍රතිමාන හෝ නීතිවල වෙනස්කම්;
- ව්‍යූහාත්මක ව්‍යාවර්තන-ගැටුමේ සම්බන්ධතා පිළිබඳ සමස්ත ව්‍යූහය සහ බල විස්තෘතිය ව්‍යාවර්තනය කෙරේ.

රූපසිංහ (1995, 1998) තර්ක කරන්නේ බහු-පථ මැදිහත්වීම් ඇසුරු කරගත් ගැටුම් ව්‍යාවර්තනයකට මගපාදන සාරසංග්‍රහ ප්‍රවේශයක් සඳහාය. බිම් මට්ටමේ ස්ථාපිත කරනු ලබන සාම කණ්ඩායම් ගොඩනැගීම යෝජනා කරන ඔහු මීට අමතරව සිවිල් සමාජ තලයේ (පවත්නා ස්ථානයන්හි) පක්ෂ හරහාත් වෙනසක් ඇති කිරීමට හැකි වාණිජ කණ්ඩායම්, මාධ්‍ය හා මිලිටරි ඒකක වැනි ඕනෑම කණ්ඩායම් සමග සාම සංධාන නිර්මාණය කිරීම ද යෝජනා කරයි. ගැටුම් ව්‍යාවර්තනය ඔහු දකින්නේ ගැටුම් නිරාකරණ පුහුණුවීම් සහ රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම් සහ සාම සාධනය අඩංගු පථ I මැදිහත්වීම් ද ඒකාබද්ධ කර ගන්නා වූ පුළුල් ප්‍රවේශයක ආකාරයෙනි.

අභ්‍යාසයෙහි යෙදෙන්නන් සඳහා ප්‍රයෝජනවත් විය හැකි ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ මත ගැන මේ දක්වා ලියැවී ඇති ඉතාමත් සවිස්තරාත්මක කෘතියක් වශයෙන් ලෙඩෙරාච්ගේ කෘතිය සැලකිය හැකිය. සාමය ගොඩනැගීම ඔහු දකින්නේ යුද ක්‍රමයක් දීර්ඝකාලීන වශයෙන් සාම ක්‍රමයකට ව්‍යාවර්තනය කිරීමක් ලෙසයි. එයට ප්‍රබෝධයක් ලබා දෙනු ලබන්නේ සාමය සහ යුක්තිය මෙන්ම සත්‍ය හා දයාව පිළිබඳ අගයන් මගිනි. මෙම ක්‍රියාවලියේ මුඛ්‍ය මානයන් වන්නේ ගැටුමේ පෞද්ගලික, ව්‍යුහාත්මක, ආනුෂංගික සහ සංස්කෘතික අංශයන්ගේ වෙනස්වීම්ය; මේවා විවිධ වූ කාල පරාසයන් තුළ (කෙටි. මැදි සහ දිගුකාලීන) වශයෙන් ද විවිධ පද්ධති තලයන් කෙරේ විවිධ අවස්ථාවල දී බලපානු ඇත.

මේ අනුව සාම - නිර්මාණය ව්‍යුහ-ක්‍රියාවලියක් හැටියට දිස්වේ. යෝග්‍ය වූ ක්‍රමෝපායක් (එනම් ගැටුම හරහා පාර්ශ්ව හා සම්බන්ධ මැද තලයේ නායකයන් අතර ජාලකරණය වැනි) යෝග්‍ය වූ කාල රාමුවකට ඇතුළු කෙරේ (එනම්, සාම කොට්ඨාසයක් ගොඩනැගීම සඳහා වාර මැද ගත යුතු පියවර ගැන අවධානය යොමු කරන අතරම බලාපොරොත්තු වන අනාගතය පිළිබඳ දෘෂ්ටියක් සහ පවතින අර්බුදය පිළිබඳ දැනුවත්වීම වැළඳ ගනිමිනි). ව්‍යුහය පිළිබඳව කල්පනා කිරීමේ දී ප්‍රභූ නායකයන් සහ තීරණ ගන්නා අය ඉහළින් ද සමාජයීය සංවිධානවල නායකයන්, පල්ලි, ප්‍රවීණ ජනමාධ්‍යවේදීන් මැදින් ද බිම් මට්ටමේ ප්‍රජා නායකයන් පාදක මට්ටමේ ද තැබෙන පිරමිඩ අදහස ලෙඩෙරාච් ඉදිරිපත් කරයි. පරිපූර්ණ වූ සාම ක්‍රියාවලියක් මේ සියලු තලයන්හි පරිපූරක වෙනස්කම් වෙත අවධානය ලක් කළ යුතු වේ.

ඔහුගේ ආදර්ශ එක් ශක්තියක් වන්නේ එය ගැටුම් සහ ගැටුම් පාර්ශවයන් තුළින් දකින දෘෂ්ටිය පුළුල් කොට සාමය ගොඩනැගීම සඳහා අවශ්‍ය වන සම්පත් පුළුල් සමාජයෙන් උකහාගැනීමට ඉඩකඩ පෙන්නුම් කිරීමයි. ගැටුම් පරිපීඩිත සමාජයේ දේශපාලන පද්ධතිය ඇතුළත පහළ වන වෙනස්වීමේ ස්වයං සිද්ධ ක්‍රියාවලිවලට ලබාදෙන අවධානය සීමිත වීම එක් දුර්වල ලක්ෂණයකි.



ලෙඩෙරාච් විසින් මතුකරන ලදුව, ගැටුම්-මැදිහත්වීම් සන්දර්භයේලා ගැටුම් නිරාකරණ ගුරු කුලය මගින් පුළුල් අයුරින් සාකච්ඡා කරනු ලබන වැදගත් කරුණක් වන්නේ අනුපරිපාටිකතාවයි. කවුරුන් විසින් කවර අවස්ථාවක කුමන ආකාරයක ක්‍රියාවක් හෝ මැදිහත්වීමක් යෝග්‍ය වන්නේ ද? ගැටුම් උත්සන්න වන අදියර නවයක් තිබෙන බව ග්ලාසල් (1982) අනුමාන කරයි. ඔහු තර්ක කරන්නේ විවිධ වූ අවස්ථා සඳහා විවිධ වූ මැදිහත්වීම් උචිත විය හැකි බවයි. ෆිෂර්ගේ සහ කීෂ්ලිගේ (1991) ආවස්ථික න්‍යාය ගොඩනගා ඇත්තේ මේ පදනම මතයි. ඉන් අදහස් වන්නේ මැදිහත්වීමේ ස්වභාවය ගැටුමේ අවස්ථාවට ගැලපිය යුතු බවයි. ගැටුම් ආරම්භක අවධිවල දී ඔවුන් යෝජනා කරන්නේ පහසුකම් සැලසීමේ කාර්යය යෝග්‍ය විය හැකි බවයි; නමුත් ගැටුමක් දෙපාර්ශවයකට බෙදී ධෘව-කාරක අවස්ථාවකට පත් වූ කල්හි බලාත්මක මැදිහත්වීමක් (නැතහොත් බලහත්කාරකමින් යුත්) අවශ්‍ය වේ. කර්ලිගේ (1971) ගැටුමේ ප්‍රගමනය පදනම් කරගත් ආවස්ථික ආදර්ශයක් අනුව තවත් විශේෂිත මතයක් ලෙඩෙරාච් (1997) ඉදිරිපත් කරයි. මෙහි දී බලයෙන් නම්මා ගැනීම වළකී.

ගැටුම් ව්‍යාවර්තන සම්ප්‍රදාය තුළ කටයුතු කරන කතුවරු ගුරුකුල තුනටම පොදු වූ ගැටුම්-ගතික පිළිබඳ අදහස්වලින් බෙහෙවින් කරුණු උකහා ගනිති. උදාහරණයක් වශයෙන් ගැටුම් සමහරවිට දරුණු හෝ මෘදු ප්‍රබල උච්චාවචන ප්‍රවණතාවන් ඇති කරයි. ගැටුමක සාමාන්‍ය රටාව වන්නේ විස්තාරණය (නව ගැටලු උරාගැනීම) පුළුල්වීම (නව ක්‍රියාකාරීන් ඇතුළත් කර ගැනීම) සහ තීව්‍රවීම (නව ගොදුරු ඩැහැ

ගැනීම) ආදියයි. එහෙත් ගැටුම් ව්‍යාවර්තනයට හැකියාව ඇතිවන්නේ පාර්ශ්වයන් තම ස්ථාවර වෙනස්කොට නව ඉලක්ක ගැන යොමු වූ විට, නව ක්‍රියාකාරීන් මතු වූ විට සහ නව තත්ත්වයන් වර්ධනය වූ විටය. මෙහි දී නව සම්බන්ධතාවලට සහ වෙනස් වූ ව්‍යූහයන්ට ඉඩකඩ සැලසේ.

ගැටුම් ව්‍යාවර්තන න්‍යායය පිළිබඳ ප්‍රවේශ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මෙම කෙටි සමාලෝචනයෙන් පැහැදිලි විය යුතු වන්නේ අසාර් සහ වෙරිනෙන් විසින් ආදර්ශ වශයෙන් පෙන්වා දෙනු ලබන සමහර න්‍යායයන් මූලික වශයෙන් විශ්ලේෂණාත්මක සහ අර්ථ නිරූපණාත්මක ස්වරූපයක් ගන්නා බවයි. මෙහි දී එම න්‍යායයන් මගින් නූතන ගැටුම්වල සැකැසීම සහ ව්‍යාවර්තනය පැහැදිලි කිරීමට උත්සාහ ගැනේ. කාර්ලි සහ ලෙඩෙරාච් වැනි අන් අය උපදේශාත්මක ස්වරූපයක් ගනිති. එයින් සාම-නිර්මාපකයනට ගැටුමේ සිට අපේක්ෂිත ප්‍රතිඵල දක්වා වූ මඟ සංකල්පනය කිරීමට මාර්ගයක් ලබාදෙයි. සමහරවිට ගල්ටුංගේ ප්‍රවේශය සංශ්ලේෂණයක ආසන්නතම තත්ත්වයක පවතී.

## 2.3 ගැටුම් - න්‍යායය සිට සන්දර්ශීය - ගැටුම් - න්‍යායයක් දක්වා

සාමය ඇති කිරීමේ අභ්‍යාසය ගැටුම් වැළැක්වීමේ සිට පශ්චාත් ගැටුම් සමයේ සාමය ගොඩනැංවීමේ කාර්යය දක්වා දීර්ඝ වී ඇති බැවින් ද, ගෝලීයකරණය මගින් අභ්‍යන්තර ගැටුම් කෙරෙහි විශාල බලපෑමක් යොදවන බැවින් ද ගැටුම් ව්‍යාවර්තන න්‍යායයන්ගේ පරාසය ඊට අනුරූපව වැඩි කළ යුතු වේ. එක් අතකින් ඒවායේ වැඩි අවධානය යොමු කළ යුතු වන්නේ ගැටුම් උග්‍ර කරන සාධකයන් වෙත සහ විවිධ අවධි කිහිපයක් හරහා ගැටුම මැඩ පවත්වා ගැනීම පිළිබඳවයි (කොටුව 1 බලන්න).



කොටුව 1 : විවිධ අවස්ථාවලදී ගැටුම් උග්‍ර කරන්නාවූ සහ මැඩ පවත්වන්නා වූ සාධක

| අවධිය / සාධක | පූර්ව ප්‍රචණ්ඩත්ව | අර්බුදය | උත්සන්න වීම | දිග්ගැස්සීම | පශ්චාත් - සමථකරණය |
|---|---|---|---|---|---|
| උග්‍ර කිරීම | පාදක වන්නා වූ හේතු | ආරම්භකයෝ | උත්සන්න කාරක | විකෘති කාරක | ආරම්භකයෝ |
| මැඩ පැවැත්වීම | ගැඹුරු වැළැක්වීම් | සරල වැළැක්වීම් | නිරුත්සන්න කාරක | ව්‍යාවර්තනක | සාම-නිර්මාපකයෝ (ගොඩනගන්නෝ) |

කෙසේ වුවද, අනික් අතට මෙම න්‍යායයන් ජාත්‍යන්තර පද්ධතියේ විවිධ තලයන් සියල්ලම තුළ, හේතු සහ නිවාරක අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයෙන් ක්‍රියා කළ යුතු වේ. සමකාලීන ගැටුම් හටගන්නා විවිධ තල පහක් හඳුනාගත හැකිය: එනම් ගෝලීය, කලාපීය, සමාජයීය, ගැටුම් පාර්ශව සහ පුද්ගල/ ප්‍රභූ යනුවෙනි (මියාල්, රැම්ස් බොතම් සහ වුඩ් හවුස් 1999). මෙම තලවල ප්‍රචණ්ඩ ගැටුම්වලට හේතු සහ නිවාරක පිළිබඳ විශේෂිත වූ උදාහරණ 2 වන කොටුවේ පෙන්වා ඇත. යොදාගනු ලබන උදාහරණ රුවන්ඩාවෙනි.

## කොටුව 2 : විවිධ තලයන්හිදී ප්‍රචණ්ඩ ගැටුම්වලට හේතු සහ වළක්වන්නෝ


| තලය | හේතු සම්බන්ධ උදාහරණ | නිවාරකයන් පිළිබඳ උදාහරණ |
|---|---|---|
| ගෝලීය | පශ්චාත් යටත් විජිත දායාදය | ජාත්‍යන්තර සුළු ජාතික අයිතිවාසිකම් |
| කලාපීය | විශාල ප්‍රදේශයක ගැටුම් පිටාර ගැලීම | OSCE සංවිධානය මගින් ගැටුම් වැළැක්වීම. |
| රාජ්‍යය / සමාජය | වාර්ගික කණ්ඩායම් රාජ්‍ය අල්ලා ගැනීම | ජනවාර්ගික පක්ෂ අතර ඡන්දය |
| ගැටුම් පාර්ශවය | ටුට්සි ජාතිකයන් කෙරෙහි හුටු විරුද්ධවාදිකම් | සුළු ජාතීන් ගත් උපයෝගීතා ප්‍රවේශය |
| ප්‍රභූ/ ජාත්‍යන්තර | හුටු නායකයන් සමූල ඝාතන මෙහෙයුමක් දියත් කිරීම | ජනාධිපති OSCE උපදෙස් පිළිගනී |

ගැටුම් න්‍යායයන් දෙස වඩාත් පටු ආකාරයෙන් බැලුවහොත් ගැටුම් පාර්ශව තලය ගැන වැඩිමනත් අවධානය යොමු කරන බව පෙනේ. එහි දී කේන්ද්‍රගත වන්නේ පාර්ශවයන්, පාදක කරුණු, ඉලක්ක සහ වෙනත් දේවල්ය. එසේ වීමේ දී ගැටුම පවතින්නා වූ සන්දර්භය මෙන්ම ගැටුම් ඉබේ ඇවිලයන ලක්ෂණවලින් සමන්විත සාධක වන ප්‍රචණ්ඩත්වය හා බැඳුණා වූ වෙළඳපොළ හා සංස්කෘතීන් ද අවධානයෙන් බැහැර වෙයි. කෙසේ වුවද, පසුබිම පිළිබඳව වැඩි නියෝජනයක් එකතු කිරීමට හැකියාව ඇත. උදාහරණයක් වශයෙන් එය ගල්ටුංගේ ගැටුම සම්බන්ධ සරල ත්‍රිකෝණාකාර සූත්‍රගත කිරීම මත නිර්මාණය කළ හැකිය. 'පරස්පරය' මතින් අපට 'සන්දර්භය' ගොඩනැගිය හැකිය; 'ආකල්ප' මත 'මතකය' සහ 'චර්යාව' මත 'සම්බන්ධතා' ගොඩනැගිය හැකිය (දෙවන රූපය බලන්න). ගැටුමක අර්ථය බොහෝ විට රඳා පවතිනුයේ එය ඉස්මතු වන්නා වූ සන්දර්භය මත බැව් මෙයින් පිළිගැනේ. පාර්ශවයන් තුළ එකිනෙකා සම්බන්ධයෙන් පවතින ආකල්ප හැඩගස්වනු ලබන්නේ පූර්ව-සම්බන්ධතා අනුවයි. ඔවුන් විසින් පිළිගනු ලබන චර්යාව තනිකරම ප්‍රතික්‍රියා දක්වනසුලු එකක් නොවෙතත් එයට පදනම් වී ඇත්තේ අතීතයේ දී සිදුවූ දේ සහ අනාගතයේදී සිදුවේ යයි බලාපොරොත්තු වන දේ මතය.

ගැටුම් *සන්දර්භය* යනු ගැටුම් පවත්නා සමාජය සහ පුළුල් වූ ජාත්‍යන්තර සහ කලාපීය තල අයත් වූවකි. සමාජය තුළ තීරණාත්මක පසුබිම් අංශ වන්නේ, සංස්කෘතිය, පාලනය, සැකසුම්, ආයතන, සමාජ කාර්යභාර, සම්මතයන්, සමාජයක යථා පරිදි තිබිය යුතු නීතිරීති සහ එහි සංවර්ධන මාර්ගයයි. උදාහරණයක් වශයෙන් වාර්ගිකත්වය, සුළු ජාතීන් හෝ රාජ්‍ය ව්‍යුහයන්ට අභියෝග එල්ල වන කරුණු සම්බන්ධ වූ ගැටුම්වලදී මතභේදයන්ට පාදක වන මූලික කාරණය වන්නේ රාජ්‍යයේ ව්‍යුහයයි. ගෝලීයකරණය ඉදිරියට ගමන් කරන විට ප්‍රාදේශීය ගැටුම් අනිවාර්යයෙන්ම පුළුල් ආර්ථික හා දේශපාලන බලවේගවල බලපෑම්වලට ලක්වෙයි. මේවා ලෝකයේ සමහර ප්‍රදේශවල වාණිජ ආයෝජන සහ තාක්ෂණ ජාලයන් ශක්තිමත් කිරීමට නැඹුරු වී ඇතත්, අප්‍රිකාව හා පැරණි සෝවියට් දේශය වැනි වෙනත් ප්‍රදේශ පර්යන්තගත කිරීමට ද නැඹුරු වී ඇත. ප්‍රතිඵලය වූයේ මෙම ප්‍රදේශවල රාජ්‍යයන් සහ

ආර්ථිකයන් දුර්වල වීම සහ සමහර අවස්ථාවල ඇත්ත වශයෙන්ම රාජ්‍ය අර්බුද නිර්මාණය වීමය. අභ්‍යන්තර ගැටුම් වැඩි වැඩියෙන් සම්බන්ධ වී ඇත්තේ දුර්වල රාජ්‍ය සහ ගෝලීයකරණයේ බලපෑමට මනා අන්දමින් ගැලපීමට නොහැකිවන ආකාරයේ ප්‍රතිචාර කෙරෙහිය.

රූපය 2 : ගැටුම් ත්‍රිකෝණය ප්‍රසාරණය කිරීම
විවිධ පද්ධති තලයන්හිදී ගැටුමෙහි ව්‍යාවර්තන කාරක සහ ප්‍රෝත්සාහකයන්






ගැටුම හටගන්නා සමාජය තුළ මෙන්ම අන් සමාජ කරා ඔබ්බට යාමේ සමස්ත අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයම *සම්බන්ධතා* සමග එකට එක්වෙයි. ලෙඩෙරාච් (1997) තර්ක කරන පරිදි ගැටුමක් සම්බන්ධයෙන් වන මෙම ආනුෂංගික අංගයන් තීරණාත්මක වෙයි. කණ්ඩායම් අතර පවතින දුර්වල සම්බන්ධතා බොහෝ විට ගැටුමක් සඳහා වන ප්‍රෝත්සාහයක් වෙයි. මේ තත්ත්වය ගැටුම් අවසන්වීමෙන් පසුව සාමය ගොඩනැගීමේ ප්‍රයත්නයන් සඳහා තීරණාත්මක බාධකයක් බවට පත්වෙයි.

*මතකයන්* යනු අවස්ථාව පිළිබඳව එක් එක් පාර්ශවය විසින් ලබාගන්නා වූ සමාජයීය අවබෝධය වන අතර, එය හැඩගස්වනු ලැබ ඇත්තේ සංස්කෘතිය හා ඉගෙනීම සහ කතිකාව හා විශ්වාසය මගිනි. කණ්ඩායම් ඔවුන්ගේ අතීතය මෙනෙහි කරන සහ නිර්මාණය කරගන්නා ආකාරය ගැටුම සඳහා

සංවිධානයවීමට කේන්ද්‍රීය වන්නේය. ඒ අනුව සමගිය යළි ස්ථාපනය කිරීමේදී සහ සංස්කෘතික සම්ප්‍රදායයන් පිළිබඳ කාර්යයේ දී සැලකිය යුත්තක් වෙයි.

සන්දර්භය, සම්බන්ධතා සහ මතකයන් යන සියල්ලම අවකාශය සහ කාල පරාසය තුළ පුළුල් වූ පසුබිමක් ඇතුළත ගැටුම් නිර්මාණයේදී පරස්පරතා, ආකල්ප සහ චර්යා සම්බන්ධ කරන්නා වූ පටකයේ කොටසකි.

මෙම අච්චුව හේතු කොට ගෙන සිදුවන්නා වූ ව්‍යාවර්තන මාදිලි පිළිබඳව වඩාත් හොඳ අවබෝධයක් ලබාගැනීමට හැකි වේ. වෙරිනන්ගේ ප්‍රවේශය පදනම් කරගෙන ගොඩනගා ඇති අංක 03 දරණ කොටුවෙන් පැහැදිලි කර දෙන්නේ ව්‍යාවර්තන හෙවත් ව්‍යාවර්තක වර්ග පහකි.

*සන්දර්භ ව්‍යාවර්තනය* යනු ගැටුම් තත්ත්වය පිළිබඳ එක් එක් පාර්ශවයේ මෙන් ම ඔවුන්ගේ අරමුණු ද මූලික වශයෙන් වෙනස් කළ හැකි ගැටුම් සන්දර්භයේ වෙනස්වීමය. කලාපීය ගැටුම් කෙරෙහි සීතල යුද්ධයේ අවසානය බලපෑ ආකාරය අගනා උදාහරණයකි. 'දියමන්ති ගැටුම්' නීති විරෝධී කිරීම සඳහා දියමන්ති වෙළෙඳාමේ නීති වෙනස් කිරීමට ගෙන ඇති යෝජනාව බරපතළ අවස්ථාවක් නොවිය හැකි නමුත් සියරා ලියෝන් සහ ඇන්ගෝලාව අතර පවතින ගැටුම් කෙරෙහි එයට සැලකිය යුතු ප්‍රමාණයේ බලපෑමක් ඇති කළ හැකිය. ලෝක දියමන්ති කවුන්සිලය ස්ථාපිත කිරීම අපේක්ෂා තැබිය හැකි ආරම්භයකි; නමුත් එයින් සැලකිය යුතු බලපෑමක් ඇතිවේ ද යන්න ගැන යමක් පැවසීමට තවම කල් මදිය.

*ව්‍යූහාත්මක ව්‍යාවර්තන* යන්නෙන් ඇඟවෙනුයේ ගැටුමේ මූලික ව්‍යූහයේ වෙනස්වීම් ගැනයි. එනම් ක්‍රියාකාරීන් පිරිස, ඔවුන් ඉදිරිපත් කරන කරුණු, නොගැලපෙන අරමුණු සහ සම්බන්ධතා, සමාජය, නැතහොත් ගැටුම පවතින ආර්ථිකය රාජ්‍යය යන අංශවල වෙනස්කම්ය. උදාහරණයක් වශයෙන් මුල් බැස තිබෙන, තුලනාත්මක නොවූ සහ මතභේදයට භාජනය වූ සම්බන්ධතා වෙනස් නොකොට අසමමිතික ගැටුම් ව්‍යාවර්තනයක් නොකළ හැකිය. එවැනි වෙනස්කම් අනුක්‍රමයෙන් පමණක් සිදුවිය හැකි අතර අභ්‍යන්තර සහ බාහිර ක්‍රියාකාරීන්ට ඒවාට දිගටම සහයෝගය දිය හැකිය. උදාහරණයක් වශයෙන් ස්ටීව් බිකෝගේ 'කළු විඥානය' (Black Conciousness) ව්‍යාපාරය මඟින් දකුණු අප්‍රිකාවේ නාගරික දිළිඳු ජනතාවට සිය ශක්තිය පිළිබඳ වැටහීම වර්ධනය කළ අතර වර්ණභේද විරෝධී ව්‍යාපාරය වර්ණභේදවාදී පාලනයේ අවසානයට පෙර, විදේශිකයන් සතු ව්‍යවසායයන්ගේ ආයෝජන වැළැක්වීම පිළිබඳ කාර්යය ඉදිරියට ගෙන යාමට උදව් කළේය. යුද අවුළුවන ආර්ථික ඕනෑ එපාකම් ගැන අවධානය යොමු නොකොට ගැටුම් ව්‍යාවර්තනය සඳහා ප්‍රයත්න දැරීමේ නිෂ්ඵලතාව බටහිර අප්‍රිකාවේ මෑතක දී ඇති වූ බොහෝ ගැටුම් තුළින් පැහැදිලි විය.



ක්‍රියාකාරක ව්‍යාවර්තනය සඳහා ක්‍රියාකාරීන්ගේ පාර්ශ්වයෙන් සිය අරමුණු හෝ ගැටුම සඳහා වූ ඔවුන්ගේ පොදු ප්‍රවේශය වෙනස් කරගැනීමට ගන්නා වූ තීරණ අයත් වේ. සාමය සෙවීමට හෝ සාම ක්‍රියාවලියක් ආරම්භ කිරීමට ගන්නා වූ තීරණ මීට ඇතුළත් වේ. ගැටුම් ව්‍යාවර්තනයක් අත්පත් කර ගැනීම සඳහා බොහෝ විට තීරණාත්මක වන නායකත්වයේ වෙනස්වීම් ද ඒවාට අයත් වේ. මෙයට ඇතුළත්වන වැඩිමනත් කරුණු වන්නේ, ජනතා කණ්ඩායම්වල තත්ත්වයේ සහ අදාළ දේශපාලන

නායකයන්ගේ ආධාරකරුවන්ගේ වෙනස්වීම්ය. මේ හේතුකොට ගෙන විශේෂිත වූ ගැටුම් ව්‍යාවර්තන කටයුතු සඳහා මාර්ග කිහිපයක්ම විවෘත වෙයි; පක්ෂය දරන ස්ථාවරය වෙනස් කිරීම සඳහා පක්ෂය තුළ සිටිමින් කටයුතු කරන අය බොහෝ විට සාම ක්‍රියාවලියේ තීරණාත්මක ක්‍රියාකාරීන් බවට ඔප්පු වන අතර පථ I සහ පථ II බාහිර ක්‍රියාකාරකයින්ට වඩා බලපෑමේ හැකියාවක් ඔවුන් තුළ තිබිය හැකිය.

උද්ගත කරුණු ව්‍යාවර්තනය යනු ගැටුමට කේන්ද්‍රගත වී තිබෙන ප්‍රධාන උද්ගත කරුණු පිළිබඳ ව පාර්ශ්වයන් අනුගමනය කරන තත්වයන් විධිමත්ව නැවත සකස් කිරීම මෙන්ම පාර්ශවයන් විසින් එම තත්ත්වයන් නැවත නිර්වචනය කිරීම හෝ නැවත ගලපා ගැනීම කරන්නා වූ ආකාරයයි. එසේ වන්නේ සම්මතයන් හෝ නිරාකරණ තත්ත්වයන් කරා ළඟාවීම සඳහාය. උද්ගත කරුණු ව්‍යාවර්තනයක් පිළිබඳව හොඳ උදාහරණයක් වශයෙන් දැක්විය හැක්කේ උතුරු අයර්ලන්තයේ යුනියනිස්ට් පක්ෂය විසින් ගන්නා ලද තීරණයයි. එය නම් උතුරු අයර්ලන්ත සහා සම්මේලනය පිළිබඳ ප්‍රශ්නයෙන් බලය ඉවත් කිරීමේ කාරණය විසන්ධි කිරීම පිළිගැනීමයි. ගැටුමට අදාළ කරුණු ගැන 'ප්‍රගතිය' ලබාගැනීම බොහෝ විට කටුක ලෙස මන්දගාමී වීමටත්, වේදනාකාරී ලෙස පසුබෑම්වලට භාජනය වන අතර ම, ඇත්ත වශයෙන්ම ප්‍රගතියක් හැටියට හඳුන්වනු ලබන දෙය පවා මතභේදයට තුඩුදීමටත් කරුණක් වෙයි.

**කොටුව 3 : ගැටුම් ව්‍යාවර්තකයෝ**

| වර්ගය | උදාහරණ |
|---|---|
| 1. සන්දර්භ ව්‍යාවර්තනය | ජාත්‍යන්තර හෝ කලාපීය පරිසරයේ වෙනස්වීම් |
| 2. ව්‍යුහ ව්‍යාවර්තන | අසමමිතික සම්බන්ධතාවලින් සමමිතික සම්බන්ධතාවලට වෙනස්වීම/ බල ව්‍යුහයන්වල වෙනස්වීම / ප්‍රචණ්ඩත්වය පිළිබඳ වෙළඳපොළවල වෙනස්වීම් |
| 3. ක්‍රියාකාරක ව්‍යාවර්තන | නායකත්වයේ වෙනස්වීම්/ අරමුණුවල වෙනස්වීම/ පාර්ශව තුළ වෙනස්වීම/ පාර්ශවයේ බල ප්‍රදේශවල වෙනස්වීම/ ක්‍රියාකාරීන් වෙනස් කිරීම. |
| 4. පාදක කරුණුවල ව්‍යාවර්තන | මතභේදයට ලක්වන කරුණු අභිබවා යාම/ සාධනීය සමථය/ පාදක කරුණු වෙනස් කිරීම/ පාදක කරුණු විසන්ධි කිරීම හෝ නැවත සන්ධි කිරීම. |
| 5. පුද්ගලික / ප්‍රභූ ව්‍යාවර්තන | දෘෂ්ටිකෝණය වෙනස්වීම/ වෙනත් මතයක් ගැනීම/ අභිමතයේ වෙනස්වීම/ සාමග්‍රීය හඟවන ඉඟි |

*තීරණාත්මක අවස්ථාවලදී තීරණ ගැනීමේ බලයක් සහිත තනි නායකයන් හෝ කුඩා කණ්ඩායම් තුළ හදවතේ හෝ මනසේ ඇතිවන පුද්ගලික වෙනස්වීම්* ඉතා වැදගත් වේ. සමහර බාහිර මැදිහත්කරුවන් මෙම නායකයන් සම්බන්ධ කර ගැනීමට ප්‍රයත්න දරා ඍජුවම මෙම පෞද්ගලික වෙනස ඇති කරලීමට කටයුතු කර ඇත (කර්ලි 1987 : මිචෙල් 2000). පෞද්ගලික වෙනස්කම් ප්‍රකාශ කරන්නා වූ නායකයන්ගේ සාමග්‍රීය ඉඟි මෙම සන්දර්භය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත.

මෙම ව්‍යාවර්තන වර්ග පහ පහසුවෙන්ම ඉහතින් හඳුනා ගෙන ඇති ගැටුම් හේතු කාරක හෝ නිවාරක තලයන්ට සම්බන්ධ කළ හැකිය. සන්දර්භ ව්‍යාවර්තන සාමාන්‍යයෙන් හටගන්නේ ගෝලීය

හෝ කලාපීය භූමිකාවක් තුළය. ව්‍යුහාත්මක ව්‍යාවර්තන සාමාන්‍යයෙන් සිදුවන්නේ රාජ්‍ය/ සමාජ තලයේ දී ය. ක්‍රියාකාරක සහ පාදක කරුණු සම්බන්ධ ව්‍යාවර්තනයන් සිදුවන්නේ ගැටුම් පාර්ශ්ව සහ ප්‍රභූ තලයන්හි දී ය. පෞද්ගලික ව්‍යාවර්තන පුද්ගල තලයේ දී කුශලතා අපේක්ෂා කරයි.

ව්‍යාවර්තන වර්ග ගැටුම් නිර්මාණයට අදාළ විවිධ කොටස්වලට ද සම්බන්ධ කළ හැකිය. මෙය අසාර්ගේ කොන්දේසි (රූපය 1 බලන්න) හෝ ගල්ටුං ගේ කොන්දේසි (2 වෙනි රූපය බලන්න) අනුව වෙනස් නොවේ. සන්දර්භය, ව්‍යුහාත්මක සහ මූලකාරණාමය ව්‍යාවර්තන ගැටුමට කේන්ද්‍රීය වන සන්දර්භය හා පරස්පරතාවන් කෙරේ බලපෑමක් ඇති කරයි. ක්‍රියාකාරක සහ පුද්ගලික ව්‍යාවර්තන විශේෂයෙන්ම බලපාන්නේ ආකල්ප සහ මතකය, චර්යාව සහ සම්බන්ධතා කෙරෙහිය. මේවා නැවත පිළිවෙලින් එකිනෙකට සම්බන්ධ වී පවතී.

අවසාන වශයෙන් මෙම විවිධ වර්ගවලට අයත් ව්‍යාවර්තන තවදුරටත් ගැටුම්වල අදියරවලට සහ මැදිහත්වීමේ කාලය නිර්ණයට සම්බන්ධ වේ. සන්දර්භ සහ ව්‍යුහාත්මක වෙනස්වීම් දීර්ඝ කාල පරාසයක් තුළ ක්‍රියාත්මක වීමේ ප්‍රවණතාවක් ඇති අතර, එය ගැටුමේ වටපිටාවට බලපෑමක් ද ඇති කරයි. අනිකුත් වර්ගවල ව්‍යාවර්තන ගැටුමේ ගතිකත්වයෙහි අංගයක් වශයෙන් ක්ෂණික ව සහ අනුක්‍රමික වශයෙන් සිදුවෙයි. එක් එක් සාම ක්‍රියාවලියක වෙනස්කම්වල අනුපරිපාටිය අවස්ථාවට අනුරූප තර්කය අනුව විවිධ වෙයි (උතුරු අයර්ලන්තය පිළිබඳ ප්‍රත්‍යෙකය සඳහා 4 වන කොටුව බලන්න). ගැටුම් ව්‍යාවර්තනය වේගවත් සහ ක්ෂණික ක්‍රියාවලියක් වන්නේ අතිශයින් සරල වූ ගැටුම් සම්බන්ධයෙන් පමණි. වඩාත් සාමාන්‍ය වශයෙන් එය මන්දගාමී සහ වේදනාකාරී වෙයි; ක්ෂණික වෙනස්වීමකට පසු ඇනහිටින අවස්ථා ඇති විය හැකි ය. මේ හේතුකොට ගෙන පෞද්ගලික ක්‍රියාපිළිවෙල ඇගැයීම අතිශය දුෂ්කර වෙයි.



**කොටුව 4 : උතුරු අයර්ලන්ත ගැටුමේ ව්‍යාවර්තකයන්**

විසිවන ශත වර්ෂයේ ඉතාමත් සියුම් ලෙස කළමනාකරණය කරන ලද ගැටුම්වලින් එකක් වශයෙන් මෙන්ම වඩාත් මෙල්ල කර ගැනීමට දුෂ්කර වූ ගැටුම්වලින් එකක් වශයෙන් ද උතුරු අයර්ලන්තය, ගැටුම් ව්‍යාවර්තනය සඳහා පාඩම් රාශියක් සපයයි. එහි විවිධ වූ ස්ථානවලින් ගැටුම් ව්‍යාවර්තනයේ තල පහටම සම්බන්ධ සාක්ෂි ලබාගත හැකිය. බ්‍රිතාන්‍ය සහ අයර්ලන්ත සමාජවල දීර්ඝකාලීන වෙනස්වීම් මගින් ද, යුරෝපීය සංගමයේ සංවර්ධනය සහ සීතල යුද්ධයේ අවසානය හේතු කොට ගෙන ද, ගැටුමේ *සන්දර්භය* වෙනස් කරන ලදී. පාර්ශවයන් අතර මෙතෙක් පැවතුණා වූ අසමමිතික සම්බන්ධතා තුලනය කිරීම සඳහා සමස්ත ජාතිකත්ව හවුල ප්‍රමාණවත් සංධාන සහ ආත්ම විශ්වාසය ගොඩනගා ගන්නා විට ගැටුම් *ව්‍යුහය* වෙනස්විය. *ක්‍රියාකාරික ව්‍යාවර්තනයන්ට* ඇතුළත් වූයේ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ වෙනස්වීම්, සින් ෆෙයින් නායකත්වය තුළ මූලික ආකල්ප වෙනස්වීම් සහ යුනියන් සාමාජිකයින් අතර බෙදීම් සහ වෙනස්වීම් ආදියයි. *උද්ගත - කරුණු ව්‍යාවර්තනයන්ට* අයත් වූයේ අයිරිෂ් සහ බ්‍රිතාන්‍ය පාලනයේ මානයන් යන දෙකම ශක්තිමත් කරන්නා වූ ආයතන ස්ථාපිත කිරීම සහ සංස්කෘතික

සම්ප්‍රදායයන් දෙකේ නීත්‍යානුකූලභාවය භාර ගැනීම සඳහා වූ මහ සිකුරාදා ගිවිසුමෙන් පිළිගන්නා ලද අන්‍යෝන්‍ය ගිවිසුම්ය. *පුද්ගලික සහ ප්‍රභූ තලයේ* දී සිත තුළ සැලකිය යුතු ප්‍රමාණයේ වෙනස්කම් සිදුවීමකින් තොරව සියල්ල නොසිදුවන්නට තිබුණි. එසේ වුවද සෑම පෙළපාලි සමයක්ම බෙදීම හා භීතිය සහගත පෙර පැවැති පරිසරය යළි සිහිගන්වන හෙයින් ගැටුම අවශේෂ වී පවතියි. විවිධ පථ පිළිබඳ ප්‍රවේශයන්හි අනුපූරක බව සහ ව්‍යුහාත්මක හා 'සංස්කෘතික' ප්‍රවේශ අතර අන්තර් සම්බන්ධතාවක් දැක්වීම සඳහා හොඳම උදාහරණය ලැබෙනුයේ උතුරු අයර්ලන්තයෙනි (බ්ලූම්ෆීල්ඩ් 1997). නිදසුන් වශයෙන් ප්‍රජා සම්බන්ධතා කවුන්සිලය බිම් මට්ටමින් ගෙන යන ලද ඉවසිලිමත් කටයුතු තරුණ දේශපාලනඥයන් සමඟ නිහැඬි සංවාදයක් කරගෙන යාමට තරම් කවුන්සිලයට සෑහෙන පිළිගැන්මක් ලබාදුනි (ෆිට්ස්ඩෆ් 1999). මෙම සාම ක්‍රියාවලිය හා ජන සමූහ අතර පැවති භේද සන්සිඳුවීම සඳහා කැපවූ දීර්ඝකාලීන ක්‍රියාවලිය තුළ 'සිවිල් සමාජය' ඉටු කළ කාර්යභාරය පිළිබඳව මෙතෙක් අපහට පැහැදිලි අවබෝධයක් ලැබී නැත. කොච්රෙන් සහ ඩුන් (2002) මේ පිළිබඳව සවිස්තර ඇගයුමක් ඉදිරිපත් කරයි.

ගැටුම සහ ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ ගතිකත්වයට ද ගැටුම් හැසිරවීම සම්බන්ධයෙන් වූ සමාජ සහ ජාත්‍යන්තර හැකියාවක් හා සබඳකමක් ඇත. පොදුවේ ගත් කල වෙනස්වීම සාමකාමීව හැසිරවීම සම්බන්ධයෙන් අතීත සම්ප්‍රදායක් සහිත එමෙන් ම සුජාත බවක් ඇති ආයතන හා නීති හා ප්‍රතිමානයන් පිළිගැනෙන සමාජ තුළ මේ හැකියාව වඩා ඉහළ මට්ටමක පැවතිය හැකිය. ඊට අනුරූප වන පරිදි තියුණු ගැටුම් සහ යුද තත්ත්වයන් පවතින අවස්ථාවල දී එය අනතුරට සහ හානිදායක බව ලක්විය හැකිය. පළමුවැනි රූපයෙන් ඉදිරිපත් කර ඇති අසාර්ගේ න්‍යායයේ සංශෝධිත සංස්කරණය යෝජනා කරන්නේ බෙදී ඇති සමාජ තුළ ගැටුම් ගතිකත්වයන් සහ ගැටුම් හැසිරවීමේ හැකියාව අතර ඇති සම්බන්ධතාවයි. අර්ථදායී ගැටුම් හැසිරවීම සමාජයට එහි ප්‍රජා ආයතන, සංස්කෘතිය හා සාමයෙන් ගැටලු කළමනාකරණ හැකියාව ගැන ආත්මවිශ්වාසයක් ඇති කරයි. තවදුරටත් එය ගැටුම් සම්බන්ධතා ව්‍යාවර්තනය කරනු පමණක් නොව එය සමාජයේ පාලන ක්‍රමය, ගැටුම් හැසිරවීම හා සාමාකාමී වෙනස්වීම ද ශක්තිමත් කරයි.

අනික් අතට විනාශකාරී ගැටුම, එයට සහභාගී වන්නන්ට සහ සහභාගී නොවන්නන්ට ඇතිවන හානි උත්සන්න වීමක ප්‍රතිඵලය වෙයි. එය තවදුරටත් පාලන පද්ධතිය, ආර්ථික රටාව සහ සමාජයේ සමාජ සම්බන්ධතා ඇතුළත් ඔවුන්ගේ සහයෝගීතා හැකියා විනාශ කරයි. සමහර අවස්ථාවල මෙයින් රාජ්‍ය පවා විනාශ විය හැකිය. දීර්ඝ කාල ගැටුම්වල දී සමාජයේ සියලු ආයතන අතිශයින් විකෘත තත්ත්වයට පත් වේ.

මෙම තරමක් පුළුල් වූ න්‍යායාත්මක වශයෙන් සැලකිල්ලට ගත් කරුණු කිසියම් රාමුවක් යෝජනා කරයි. ඒ මගින් අපට ගැටුම් ව්‍යාවර්තන අභ්‍යාස විශ්ලේෂණයට භාජනය කිරීමෙන් සහ ඇගැයීමට ලක් කිරීමෙන් ගැටුම් හැසිරවීම සඳහා ජාත්‍යන්තර හැකියාවේ හිඩැස් සහ දුර්වල කම් සලකා බැලිය හැකිය.

# 3. ගැටුම් නිරාකරණ අභ්‍යාස

## 3.1 ගැටුම් ව්‍යාවර්තනයේ ක්‍රියාකාරීහු

ගැටුම් ව්‍යාවර්තනය සාමාන්‍යයෙන් පුළුල් පරාසයකට අයත් ක්‍රියාකාරීන් සම්බන්ධ කර ගනිමින් පුළුල් මෙන්ම නිතර භාවිත වන අභ්‍යාසයන් ප්‍රයෝජනයට ගනී. මේවා කෙසේ වුවද ප්‍රධාන ක්‍රියාකාරක කණ්ඩායම් හතරකට වර්ග කළ හැකිය. වර්තමානයේ පවතින අභ්‍යාස ක්‍රම ඉදිරියට ගෙන යන්නේ මොවුන් විසිනි.

- රාජ්‍ය සහ අන්තර් ආණ්ඩු සංවිධාන
- මානුෂවාදී සංවිධාන වර්ධනය කිරීම
- ගැටුම් නිවාරණ සහ ව්‍යාවර්තන කාර්යයන් ගැන උනන්දුවක් දක්වන රාජ්‍ය නොවන ජාත්‍යන්තර සංවිධාන
- ගැටුමට සම්බන්ධ පාර්ශ්ව සහ පීඩාවට පත් සමාජ තුළ සිටින වෙනත් අදාළ කණ්ඩායම්

ඔවුන් එක් තැන් වූ විට මතු වන කරුණු සලකා බැලීමට පෙරාතුව එක් එක් කණ්ඩායමේ නියමිත කාර්යයන් සමහරක් මම කෙටියෙන් සාකච්ඡා කරමි.

පථ 1 හා සම්බන්ධ අභ්‍යාසකරුවන් වන රාජ්‍ය සහ ජාත්‍යන්තර සංවිධාන, ක්‍රියාකාරීන් අතුරින් බලවත් ම සංවිධාන වන්නේය. එසේ වී ඇත්තේ ඔවුන්ගේ කටයුතු ගැටුම් පාර්ශවයන් මත සෘජුවම හා ප්‍රබල අන්දමින් බලපෑමක් ඇති කරන බැවින් හා ඔවුන්ගේ මැදිහත්වීම්වල ධනාත්මක සහ සෘණාත්මක ප්‍රතිඵල ඉඳුරාම මහජන අවධානයට ලක්වන බැවිනි. 1990 ගණන් ආරම්භ වූයේ බලාපොරොත්තු සහගත අවධියක් සමගයි. එවක එක්සත් ජාතීන්ගේ සංවිධානය බූට්‍රෝස් බූට්‍රෝස් ගාලිගේ *සාමය සඳහා න්‍යාය පත්‍රය* (ඇජෙන්ඩා ෆෝ පීස්) යන කෘතියේ පෙන්වා දෙන ලද සාමය ඇති කිරීම සම්බන්ධ විස්තාරණය කරන ලද සංකල්පය ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් විය. ඒ සඳහා තෝරාගනු ලැබුවේ මෑතක දී සාම විසඳුම් ළඟා කර දුන් සාමය, ගොඩනැංවීමේ ක්‍රියාකාරකම් සැලකිය යුතු අන්දමින් ක්‍රියාත්මක වූ කාම්බෝජය, නැමීබියාව, ඇන්ගෝලාව, මොසැම්බිකය සහ එල්සැල්වදෝරය යන රටවල්ය.

මෙම අවස්ථා හේතු කොට ගෙන සාමය ගොඩනැංවීම සඳහා එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට ප්‍රයෝජනයට ගත හැකි පොදු ආකෘතියක් ඉස්මතු විය. එම ආකෘතිය හමුදා බලය ඉවත් කිරීම, අවිහරණය සහ විරුද්ධ හමුදා කොටු කිරීම සාක්ෂාත් කර ගැනීම සඳහා මිලිටරි ක්‍රියාමාර්ග ඉල්ලා සිටී. එමෙන්ම මැතිවරණ ක්‍රියාත්මක කිරීම සඳහා සහ අන්තර්වාර ආණ්ඩුවක් ස්ථාපිත කිරීම සඳහා ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග ද සිවිල් ආණ්ඩුවක් පවත්වාගෙන යාම සඳහා සහ යටිතල පහසුකම් සඳහා සහයෝගය ද ඉල්ලා සිටී. මෙයට පුහුණු කිරීම් සහ අවශ්‍ය වන්නේ නම් ප්‍රාදේශීය පොලීසිය මගින් අධීක්ෂණය කිරීම ද ඇතුළත් වේ. මානව හිමිකම් ක්‍රියාමාර්ග, සරණාගතයන්ගේ ආපසු පැමිණීම සහ යුද්ධයෙන් හානි වූ යටිතල පහසුකම් පිළිසකර කිරීම ද මෙම පොදු ආකෘතියෙන් අපේක්ෂිතයි. ආරම්භයේ දී මෙම ආකෘතිය අතිශයින් සාර්ථක එකක් වශයෙන් පෙනී ගියේය. නැමීබියාව සහ මොසැම්බිකය වැනි රටවල් ගත් කල යුද්ධයේ සිට සාමකාමී ව්‍යාවර්තනයක් ඇත්ත වශයෙන්ම ලබාගත්තේය. කෙසේ වුවද ඇංගෝලාව සහ කාම්බෝජය වැනි වෙනත් රටවල ප්‍රචණ්ඩ ගැටුම් නැවතත් ආරම්භ විය. එක්සත්

ජාතීන්ගේ මණ්ඩලය සහ වෙනත් ප්‍රධාන රටවල් මෙම මෙහෙයුම්වලින් පාඩම් ඉගෙන ගනිමින් සිටී. ඒ අතරම සාමය ගොඩනැගීමේ මෙහෙයුම් විහිදුවීමක් ද කරගෙන යයි. උදාහරණ වශයෙන් බොස්නියාව සහ කොසෝවෝ ගෙන හැර දැක්විය හැකිය. මෙම අවස්ථාවලදී ජාත්‍යන්තර මැදිහත්වීම් හේතු කොට ගෙන වාර්ගික යුද්ධ නැවතී ගිය සේ පෙනෙන අතර, පාදක වී තිබෙන ගැටුමේ ව්‍යාවර්තන ප්‍රමාණය සීමිත වී පවතී. ජනවර්ගී-ජාතිකත්ව නායකත්වය ඉතිරි වී පවතී. යුද්ධයේ වාර්ගික බෙදීම් සම්බන්ධ යථාර්ථයන් පදනම් කරගත් නිරාකරණ සාමයේ දී මෙම බෙදීම් ආරක්ෂා වී ඇත.

අවධානයට ලක්වන මෙම කැපී පෙනෙන අවස්ථා බෙදී ගිය ජාත්‍යන්තර ප්‍රජාව විසින් දෙගිඩියාවෙන් ගත් ප්‍රයත්න මගින් ඇත්ත වශයෙන්ම ආරෝපණය කරන ලද නිරාකරණ වෙයි. වඩාත් සිත් ගන්නාසුලු වූයේ ප්‍රචණ්ඩ වීමට පෙරාතුව ගැටුම් වැළැක්වූ අවස්ථා, එසේම ගැඹුරු හෝ ව්‍යුහාත්මක සහ සැහැල්ලු හෝ ක්‍රියාකාරී ගැටුම් වැළැක්වීම එක්විට ක්‍රියාත්මක වූ අවස්ථා ද වේ. මෙහිදී ගැටුම් සන්දර්භයේ සහ සමාජයන්ගේ ව්‍යුහයේ තථ්‍ය වෙනස්වීම් හේතු කොට ගෙන සිත් ගන්නාසුලු ව්‍යාවර්තන ඇති විය.

උදාහරණයක් වශයෙන් එස්ටෝනියාව පිළිබඳ ප්‍රත්‍යෙකයේදී ඇතිවීමට ගිය වාර්ෂික ගැටුමක් අර්ධ වශයෙන් වළක්වන ලද්දේ ජාතික සුළු ජාතීන් පිළිබඳ OSCE මහ කොමසාරිස්ගේ ප්‍රකට මැදිහත් වීම් මතය. යුරෝපීය සංගමය සහ ස්කැන්ඩිනේවියානු රාජ්‍යයන් ද ඔහුට සහයෝගය දැක්වීය. යම් දුරකට ව්‍යාවර්තිත ආර්ථික සන්දර්භය රුසියන් භාෂා කතා කරන ජනතාව වෙනුවෙන් වූ දිරිගැන්වීම් වෙනස් කිරීමට උපකාරී විය. තවදුරටත්, අතිරේක මූලික සාධකයක් වූයේ තිරස්-වාර්ගික ඡන්ද පාවිච්චිය සඳහා දිරිගැන්වීම් නිර්මාණය කළා වූ ඡන්ද ක්‍රමයක් හඳුන්වාදීමයි. මේ හේතු කොට ගෙන ප්‍රතිඵලය වශයෙන් වාර්ගික දේශපාලනයේ සිට ආර්ථික සහ කලාපීය අපේක්ෂා කණ්ඩායම්වල දේශපාලනය දක්වා වූ සංක්‍රමණයක් ඉස්මතු විය. එස්තෝනියානු පක්ෂ විසින් පක්ෂ ලැයිස්තුවලට එස්තෝනියානු නොවන දේශපාලනඥයන් ද ඇතුළත් කර ගන්නා ලද අතර, එස්තෝනියානු මධ්‍යම පක්ෂය ඔවුන්ගේ අභිලාෂ තහවුරු කර ගැනීම සඳහා වාහකයක් වශයෙන් රුසියානු භාෂකයන්ගේ පුළුල් සහයෝගය දිනා ගත්තේය. එය ගැටුම් කළමනාකරණය සහ වාර්ගික සහනීය ප්‍රවේශය (accomodation approach) සඳහා බෙහෙවින් කැපී පෙනෙන ජයග්‍රහණයකි. එයට අවසර ලැබුණේ 1991 න් පසු ඇති වූ එස්තෝනියානු සන්දර්භයේ ව්‍යාවර්තනයට පසුවය.



දෙවැනි වර්ගයේ ක්‍රියාකාරීන් වන්නේ සංවර්ධන සහ මානුෂවාදී නියෝජිතායතනයි. 1980 ගණන්වල දී සහ 1990 ගණන්වල දී මෙම නියෝජිතායතන යුද්ධයෙන් විනාශ වූ සමාජ නැවත ගොඩනැගීමේ වියදම් අධික කටයුතු වෙත දැඩි ලෙස ඇදී ගියේය; අවි ගැටුම් හේතු කොටගත් තදබල හානියට ද ප්‍රතිචාර දැක්වීය. එහි දී ඉලක්ක කරගනු ලැබුවේ විශේෂයෙන්ම සාමය ගොඩනැගීමේ කාර්යය සඳහා වූ සංවර්ධන වැඩසටහන්ය. සමහර අවස්ථාවල දී ඒවායේ ක්‍රියාකාරකම් එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ මෙහෙයුම්වලට සහයෝගය දැක්වීය: උදාහරණයක් වශයෙන් මොසැම්බිකයේ ආධාර දෙන කණ්ඩායම් මැතිවරණ නියමිත කාලයට පැවැත්වීමට උදව් කළ අතර, RENAMO සංවිධානය දේශපාලන පක්ෂයක් බවට හැරවීම සඳහා උදව් දුන්නේය. වෙනත් අවස්ථාවල දී සංවර්ධන ආධාර කෙළින්ම ගැටුම් ලිහිල් කිරීම සඳහා යොමු කළ හැකිය. ආධාර ලබාදෙන කණ්ඩායම් සෝමාලියාවේ නොසලකා හරින ලද ප්‍රදේශවල පදිංචි සරණාගත ජනයාට ආධාර කිරීම මෙවැනි අවස්ථාවකි. එහි පරමාර්ථය වූයේ දේශපාලන වශයෙන් අස්ථායී ප්‍රදේශයක අසහනය අවම

කිරීමයි. ළමා සොල්දාදුවන් යළි පවුල් හා සම්බන්ධ කිරීම හෝ කෘෂි කාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීම සඳහා සහයෝගය ලබාදීමට ඇති කරන ලද වැඩසටහන් සංවර්ධන මෙහෙයුම් සම්බන්ධ වැඩිදුර උදාහරණ වෙයි. මෙම මෙහෙයුම් තුළ සාමය ගොඩනැගීමේ අංගයක් පහසුවෙන් අඩංගු විය හැකිය. ධාරිතා ගොඩනැගීම සහ දේශීය ගැටුම් හැසිරවීමේ ධාරිතාවට සහයෝගය ලබාදීම ද අතිශයින් තීරණාත්මක වන්නේය. එවැනි කටයුත්තක් පිළිබඳ කැපී පෙනෙන උදාහරණයක් වන්නේ ඔක්ස්ෆෑම් සංවිධානය මගින් සිදු කරන ලද උතුරු කෙන්යාවේ ගැටුම් ව්‍යාවර්තන කාර්යයන්ය (කොටුව 5 බලන්න).

ඇත්ත වශයෙන්ම සංවර්ධන ආධාරවල අපේක්ෂිත මෙන්ම අනපේක්ෂිත ප්‍රතිඵලද තිබිය හැකිය; සමහර අවස්ථාවලදී ගැටුමට සම්බන්ධ පාර්ශ්ව විසින් ආධාර බලෙන් පැහැර ගෙන සටන් පවත්වා ගෙන යනු ලැබේ. ගැටුම් කෙරෙහි සංවර්ධන ව්‍යාපෘතිවල බලපෑම තක්සේරු කිරීම සඳහා වන දර්ශකයන්ගෙන් යුත් ආකෘතියක් ස්ථාපිත කිරීම සඳහා වන වර්තමාන වැඩකටයුතු වඩාත් හොඳින් ඇගැයීමට වුවමනා වන ආකෘතියක අවශ්‍යතාව ළඟා කර ගැනීම තරමක් දුරට ප්‍රමාණවත් වෙයි (මෙම වෙළුමේ එන මාක්හොෆ්මන්ගේ සහ මේරි ඇන්ඩර්සන්ගේ ලිපි බලන්න). එවැනි දර්ශකයන්ගෙන් සමන්විත ආකෘතියක් ඉහත දී ඉදිරිපත් කරන ලද ආකාරයේ ගැටුමේ සමස්ත ව්‍යාවර්තනය අවබෝධ කර ගැනීම සඳහා වන ආකෘතියකට ආපසු සම්බන්ධ කළ යුතු වේ.

සංවර්ධන නියෝජිතායතන මෙම ක්ෂේත්‍රයේ දී වැදගත් සහ බලපෑම් කළ හැකි තත්ත්වයක පැවතියත් තෝරාගත් ගැටුම් ව්‍යාවර්තනයේ මූලික වගකීම බාර ගන්නවාට වඩා (මෙම කාර්යභාරය තවමත් අලුත් සහ පරීක්ෂණයට භාජනය නොකරන ලද කාර්යයක් සේ සලකනු ලැබෙයි) ඔවුන් තම කාර්යභාරය දකින්නේ ප්‍රධාන වශයෙන් අනික් අයගේ කටයුතුවලට සහයෝගය සහ ධෛර්ය දැක්වීමක් හැටියටයි. මේ හේතු කොට ගෙන ගැටුම් ව්‍යාවර්තන කටයුතුවලින් වැඩි කොටසක් රාජ්‍ය නොවන සංවිධාන වෙත පැවරී තිබේ.



### කොටුව 5 : උතුරු කෙන්යාවේ ගැටුම් ව්‍යාවර්තන කටයුතු

උතුරු කෙන්යාව තුළ වියළි ඉඩම් කෙරේ වැඩිවන තෙරපුම සහ සම්ප්‍රදායික හරක්-කොල්ලකෑමට ඇතුළත් කොට ඇති කලෂ්නිකොෆ් තුවක්කු සංස්කෘතිය හේතු කොටගෙන සංක්‍රමණික එඬේර ප්‍රජාවන් අතර මෙන්ම එඬේර කොටස් හා කෘෂිකාර්මික කොටස් අතර පවතින ගැටුම් ප්‍රමාණයෙන් හා තියුණුකමින් වැඩි වී තිබේ. තුර්කානා හා පෝකොට් හෝ සෝමාලි හා බොරානා වැනි ඓතිහාසික විරුද්ධවාදී කොටස් පමණක් නොව, 1980 ගණන්වල සිට සාමකාමීව එක්ව ජීවත් වූ ජනකොටස් පවා දැන් යුද්ධයෙහි ගැලී සිටිති. මෙම එඬේර ප්‍රජාවන් සන්නද්ධ කිරීම හේතු කොට ගෙන කෙන්යාවේ හා අසල්වැසි ප්‍රාන්ත රාජ්‍ය තුළ සුරක්ෂිතභාවය තදබල අන්දමින් තර්ජනයට ලක් වී තිබෙන අතර, පීඩනයට ලක් වී ඇති ප්‍රජාවන්ට හානිදායක වී තිබේ. මෙයට ප්‍රතිචාරයක් වශයෙන් (1997) බරගෝයි එඬේර ව්‍යාපෘතියේ දේශීය වැඩිහිටි නායකයන් විශ්වාසය තබා සාම සාකච්ඡාවලට ඔක්ස්ෆෑම් සංවිධානය මගින් පහසුකම් සලසන ලදී. ඔක්ස්ෆෑම් සංවිධානය මගින් ක්‍රියාත්මක කරමින් පවතින කාර්යයේ වැදගත් අංගයක් වන්නේ භාෂාවේ

යොදාගන්නා වූ වචන සහ මානව වංශීය කරුණු පිළිබඳ විශ්ලේෂණයක් මාර්ගයෙන් මෙම ජනතාවගේ ගෞරවය හා චර්යා පද්ධති සහ ගැටුම පිළිබඳ ඔවුන් තුළ පවතින අවබෝධය ඇගයීමේ ප්‍රයත්නය යි (කෝනා 1999). මෙම ප්‍රවණතාව අනුව පීඩාවට පත් ප්‍රජාවන්ගේ කාන්තාවන්ගෙන් සමන්විත ප්‍රාදේශීය කමිටුවක් මගින් වජීර් සාම සහ සංවර්ධන කමිටුව පිහිටුවා ගන්නා ලදී; මෙය රාජ්‍ය සංවිධාන 27 කින් යුත් ජාලයකින් සහ ඊසාන දිග කෙන්යාවේ රාජ්‍ය නොවන සංවිධානවලින් සමන්විත වේ. මෙම කණ්ඩායම පුහුණු හා ධාරිතා ගොඩනැගීමේ කටයුතුවල යෙදෙන අතර 1993 දී ගැටුම් නිවාරණය සහ නිරාකරණය කිරීමටත් කලාපයේ පවතින ප්‍රාදේශීය ගැටුම් නිරාකරණයටත් අඛණ්ඩව ප්‍රයත්න දරයි (European Platform for conflict prevention, 1992a, 152;1999b,243-47).

මෙහි දී සාකච්ඡාවට භාජනය වූ ක්‍රියාකාර කණ්ඩායම් අතුරෙන් ගැටුම් ව්‍යාවර්තන න්‍යායයන්ට වැඩිපුරම අවධානය යොමු කරන ලද්දේ රාජ්‍ය නොවන සංවිධාන විය හැකිය. ලෙඩේරාච් අනුගමනය කරමින් රාජ්‍ය නොවන සංවිධානවලට අයත් ක්‍රියාකාරීහු දීර්ඝ කාලයක් පුරා තිරසාර මට්ටකින් නිරත වී සිටීම නිර්දේශ කරති. එහිදී ගැටුමට සම්බන්ධ පාර්ශවයන් සමග මෙන්ම එයට පරිබාහිර ජනතාව සමගත් ඉතා සමීප වශයෙන් කටයුතු කරන ඔවුන් සොයන්නේ ගැටුමේ නිධානය පිළිබඳ ගැඹුරු අවබෝධයකි. සංවාදය සඳහා අවකාශයක් ඇති කිරීමටත්, සාමය කරා යන මාර්ග පිළිබඳ ප්‍රාදේශීය සහ ජාතික සම්මේලන සහ වැඩමුළු නොකඩවා පවත්වාගෙන යාමටත්, එමෙන්ම දීර්ඝකාලීන වශයෙන් සංවර්ධනය සඳහා අවස්ථා හඳුනා ගැනීමටත්, සාමය ගොඩනැගීම, සම්බන්ධතා ගොඩනැගීම සහ ආයතන ගොඩනැගීමේ කටයුතුවල නිරතවීමටත් ඔවුහු බලාපොරොත්තු වෙති.



පථ II ක්‍රියාකාරීන් විසින් යොදාගන්නා ක්‍රම සහ මෙවලම්වලට ඇතුළත් වන්නේ දේශීය කණ්ඩායම් හා සමාජ ව්‍යාපාරවලට ආධාර ලබාදීම හා පවත්වාගෙන යාම, සාම කලාප ගොඩනැගීම, ධාරිතාව වර්ධනය කිරීම, මුල් පෙළේ ක්‍රියාකාරීන් බලගැන්වීම, සංවිධාන කටයුතු සංවර්ධනය සහ ජාලකරණය සහ පුහුණුව ලබාදීමයි. මේ ආකාරයේ වැඩපිළිවෙලක් සඳහා කැපී පෙනෙන උදාහරණයක් වන්නේ ලංඩන් මූලස්ථාන කරගත් රාජ්‍ය නොවන සංවිධානයක් වන කොන්සිලියේෂන් රිසෝර්සස් (CR) ඉන් ෆීජි සංවිධානයේ වැඩසටහනයි. එයට දේශීය ක්‍රියාකාරීන්ගේ සහභාගීත්වය ද ලබාගැනිණි. CR සංවිධානය ෆිජී රාජ්‍යයේ පුරවැසි ව්‍යවස්ථාදායක සමුළුවට සහයෝගය දැක්වීය. එම සංවිධානය විකල්ප-ඡන්ද ක්‍රමය සහ බලය බෙදා ගැනීම හඳුන්වා දෙමින් 1996 දී නව ව්‍යවස්ථා සමථකරණයට ඉතා වැදගත් දායකත්වයක් ලබා දුන්නේය. අවාසනාවකට මෙන් 2000 මැයි මාසයේ දී ෆිජී රාජ්‍යයේ ඇති වූ රාජ්‍ය කුමන්ත්‍රණය සහ පටු බහුතරයක් පදනම් කරගත් ආණ්ඩුවක් පෙරළා ඇතිවීම පැහැදිලිව පෙන්වා දෙනුයේ මේ ආකාරයේ කටයුතුවලට මුහුණපෑමට සිදුවන පසුබෑම්ය.

මේ සඳහා එක් මුඛ්‍ය අවශ්‍යතාවක් වන්නේ මනා ගැටුම් විශ්ලේෂණයකි (කොටුව 6 බලන්න). එවැන්නක් සකස් කළ යුතු හොඳම ක්‍රමය වන්නේ ගැටුමට සම්බන්ධ කණ්ඩායම්වල සහයෝගය උපයෝගී කර ගැනීමයි. යෝග්‍ය පරිදි සංවර්ධනය කරන ලද න්‍යායයකින් අභ්‍යාසය උකහාගත යුතු එක් පැහැදිලි විෂය පථයක් වන්නේ ගැටුමක වෙනස්වන ගතිකත්වයන් පසුපස කාලයක් තිස්සේ ගොස් නිරීක්ෂණය කිරීමයි.

**කොටුව 6 : ගැටුම් විශ්ලේෂණය**

වේහර්ගේ (1979), ගැටුම් වැඩසටහන් මාර්ගෝපදේශ මුල් කෘතියට තවමත් වටිනාකමක් ඇත. මියාල්, රැම්ස් බොතම් සහ වුඩ්හවුස් (1999) බ්ලූම්ෆීල්ඩ් සහ රෙයිලි (1998) ලියෝන් හාර්ට් (2000) විසින් ලියන ලද වඩාත් මෑතකදී නිකුත් වූ කෘතිවලින් මාර්ගෝපදේශ සොයාගත හැකිය. මූලික ශිල්පීය ක්‍රමය වන්නේ මූලික ක්‍රියාකාරීන්, ඔට්ටුකරුවන්, උද්ගත කරුණු සහ සම්බන්ධතා හඳුනාගත හැකි ගැටුමේ දළ චිත්‍රයක් සකස් කරගෙන ඊට පසු ක්‍රියාකාරීන්, තුන්වන පාර්ශවයන් හෝ වෙනසක් ඇති කළ හැකි විභවයක් සහිත සාම සන්ධාන හඳුනා ගැනීමයි. වඩාත් විචක්ෂණශීලී ගැටුම් ගවේෂණයේ දී ගැටුම් පිළිබඳ දර්ශක කෙරෙහි විශ්වාසය තැබේ. එම දර්ශක කල් වේලා ඇතිව අනතුරු ඇඟවීමේ කාර්යයන් සහ බලපෑම් තක්සේරු කිරීමේ කාර්යයන් සඳහා භාවිත කරනු ලැබේ (ෂ්මිඩ් 1997, ජොන්ග්මාන් 2000; මෙම වෙළුමේ පැෆෙන්හොල්ස් ගේ ලිපි බලන්න).

අවසාන වශයෙන්, ඉතාම වැදගත් වනුයේ, දේශීය ක්‍රියාකාරීන් වෙත පවා තමන්ගේම ගැටුම් ව්‍යාවර්තනය සඳහා අතිවිශාල වගකීමක් ඇති අතර අති ප්‍රබල අවස්ථාවක් ද එළැඹ ඇත. ගැටුම්වල 'නිමග්න වූ තුන්වැනි පාර්ශවයන්' ගැටුම් පාර්ශ්ව තුළින් එළියට පැමිණ සංවාදය සඳහා අවස්ථා විවෘත කරදෙමින් ද දේශපාලන අවකාශ විවෘත කර දෙමින් ද මහඟු කාර්යභාරයක් ඉටු කරන අවස්ථා ඇත; උතුරු අයර්ලන්තයේ ජෝන් හියුම් එවැන්නෙකි. තවත් අවස්ථා වන්නේ දේශපාලන පක්ෂ අභ්‍යන්තරයේ සිටින කණ්ඩායම්ය. ශින්ෆෙන් සංවිධානය දේශපාලන ස්වරූපයේ අරගලයකට වෙනස් වීම වැනි ක්‍රියාකාරික ව්‍යාවර්තනයක් ගෙන ඒමට එම අභ්‍යන්තර කණ්ඩායම්වලට හැකි වේ; සිවිල් සමාජයේ ක්‍රියාකාරීන්ට සහ දේශීය රාජ්‍ය නොවන සංවිධානවලට ද දේශපාලන පක්ෂ අතර සබඳකම් පිහිටුවීම සඳහා බොහෝ විට අති මහත් බලපෑමක් ඇති කිරීමේ හැකියාව උතුරු අයර්ලන්තයේ ක්ලෝනාර්ඩ් ආශ්‍රමය විසින් ආදර්ශ වශයෙන් පෙන්වා දී ඇත; දේශීය ප්‍රජාවන් සහ සංස්කෘතික සම්ප්‍රදායන්ට ගරු කිරීම පිළිබඳව කටයුතු කිරීම මගින් ඓතිහාසික මතයකයන් සහ සමගිය යළි ස්ථාපනය කිරීම සඳහා ආදර්ශ සපයන කොරිමීලා ප්‍රජා සංවිධානය ද එක් නිදර්ශනයකි. ගැටුමේ සාර්ව මට්ටමේ දී සාමය ගොඩනැගීමේ මෙම බලපෑම ඇගැයීම ඉතා අසීරුය. නමුත් කුඩා පරිමාණයෙන් සාක්ෂාත් කර ගත හැකි පෞද්ගලික සහ කණ්ඩායම් ව්‍යාවර්තන තියුණු අන්දමින් දුනේ.



## 3.2. සම්බන්ධීකරණය සහ බහු-පථ උපායශීලීත්වය/ රාජ්‍යතාන්ත්‍රිකත්වය

ගැටුම් ව්‍යාවර්තන කාර්යයට මුහුණදීමට සිදුවී ඇති විශේෂිත වූ අභියෝගයක් වන්නේ අනිකුත් පථයන්හි හටගන්නා මැදිහත්වීම් සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් වන අන්දමින් උපරිමයෙන් ක්‍රියා කළ හැක්කේ කෙසේද යන ප්‍රශ්නයයි. සමහර අවස්ථාවල දී ඵලදායී සහයෝගීතාවයක් ඇති වේ. උදාහරණයක් වශයෙන් මැසිඩෝනියාවේ ප්‍රත්‍යෙකය ගෙන හැර දැක්විය හැකිය (කොටුව 7 බලන්න).

කෙසේ වුවද, නිරන්තරයෙන්ම වාගේ විවිධ පථයන්හි සිටින අභ්‍යන්තර සහ බාහිර ක්‍රියාකාරීහු එකිනෙකා වටහා නොගැනීමේ තත්ත්වයට පත්ව සිටිති. විවිධ ගොනු කිරීම් අතර තිබෙන්නා වූ පරස්පරතාව සැලකිල්ලට ගත් කල මෙය පුදුම විය යුතු දෙයක් නොවේ. එක පථයක කෙරෙන ක්‍රියාකාරකම් නිසා සමහරවිට තවත් පථයක ප්‍රයත්න කඩාකප්පල් විය හැකිය. උදාහරණයක් වශයෙන් අවිහිංසාවෙන් ගැටුම් නිරාකරණය සඳහා ප්‍රයත්න දරන සංවිධානයකට, කිසියම් විසඳුමක් භාරගන්නා මෙන් දේශීය විරුද්ධ වාදීන්ට බලපෑම් ඇති කිරීම සඳහා පීඩාකාරී ක්‍රියාමාර්ග අනුගමනය කරන රජයක් සමග සහයෝගයෙන් කටයුතු කිරීම අසීරු වනු ඇත. අනෙක් අතට රාජ්‍ය නොවන සංවිධාන රාජ්‍යතාන්ත්‍රික කටයුතුවලට රිංගා ගැනීම ගැන විදේශ අමාත්‍යාංශ සාමාන්‍යයෙන් උනන්දුවක් දක්වන්නේ නැත.

රාජ්‍ය නොවන තලයන්හි ගැටුම් ව්‍යාවර්තන ක්‍රියාකාරකම්වල නිරත අභ්‍යාසයෙහි යෙදෙන අය තම ඉලක්ක කරා යාමේ දී ගැටුම් පවතින ප්‍රදේශයේ සිටින අනික් පාර්ශවයේ ක්‍රියාකාරීන්ගේ සංස්කෘතිය සහ අරමුණු මෙන්ම ඔවුන් මුහුණ දෙන බාධක ගැන ද සංවේදී විය යුතුය. ඔවුන් විසින් සැමවිටම සිතේ තබාගත යුතු වන්නේ සමහරවිට අනෙක් පාර්ශවයේ ක්‍රියාකාරීන් කෙරෙහි බලපෑමක් ඇති කිරීමට තමන්ට හැකියාවක් නොලැබෙන්නට ඉඩ ඇති බවයි. එම ක්‍රියාකාරීන්ගේ වැඩකටයුතු හේතු කොට ගෙන ඔවුන්ගේම වැඩවලට බලපෑමක් ඇතිවීමට ඉඩ තිබේ. තව දුරටත් ගැටුම් ප්‍රදේශයෙන් පරිබාහිරව තිබෙන පථ I සංවිධානවල ප්‍රතිපත්ති වෙනස් කිරීම ගැටුම් ව්‍යාවර්තනයට සම්බන්ධ කරගත් විට ඔවුන්ගේ මෙහෙයුම පුළුල් වනවා ඇත. උදාහරණයක් වශයෙන්, ඉතා විශාල වශයෙන් පිළිගෙන ඇති කරුණක් වන්නේ ලෝක බැංකුව වැනි ආයතනවලට ගැටුම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි බවයි. ඒ අනුව ඔවුන්ගේ ප්‍රතිපත්තිවලට බලපෑම් ඇති කිරීම සඳහා වන උද්ඝෝෂණ ව්‍යාපාර, ගැටුම් ව්‍යාවර්තනයට සම්බන්ධ පුළුල් මෙහෙයුමේ නිත්‍ය කොටසක් බවට පත්වී තිබේ.



**කොටුව 7 : මැසිඩෝනියාවේ සහයෝගී බහු පථ රාජ්‍යතාන්ත්‍රිකත්වය**

මැසිඩෝනියානු ප්‍රත්‍යෙකය අනුව වෙනස් වූ පථ මගින් ආරම්භ කරනු ලබන විවිධ පියවර සත්‍ය වශයෙන්ම අනුපූරක වෙයි. උදාහරණයක් වශයෙන් ජාතික සුළු ජන කොටස් පිළිබඳ OSCE මහ කොමසාරිස් (බාහිර පථ I) ස්කෝප්ජයෙහි විවෘත සමාජ ආයතනය (බාහිර පථ I) හා එක්වී විශ්වවිද්‍යාල ප්‍රශ්නය සම්බන්ධයෙන් ගිවිසුම් විසඳුම් කිහිපයක් ඉදිරිපත් කළේය. සමථයක් සඳහා යුගොස්ලෝවියාව පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය (පථ I) මැසිඩෝනියාව සහ වාර්ගික සර්බියානුවන් අතර කිසියම් ගිවිසුමක් ඇති කිරීමට තැරැව්කරුවෙකුගේ කාර්යභාරය ඉටු කළේය. ඒ අතර කෝල්බෲක් සහ ඇමෙරිකා ආණ්ඩුව (පථ I) ග්‍රීසිය සහ මැසිඩෝනියාව අතර ගිවිසුම් තීරණාත්මකව ලබාගත්තේය. මේ හේතු කොට ගෙන රාජ්‍ය සම්බාධකය ඉවත්විය. රාජ්‍ය නොවන සංවිධානයේ සර්ච් ෆෝ කොමන් ග්‍රවුන්ඩ් (පොදු සම්මුතියක් සෙවීම) (බාහිර පථ III) පොදු ජන තලයේදී ප්‍රජා කණ්ඩායම් දෙකේම පොදු අවශ්‍යතා සලසාදීමේ පරමාර්ථය ඇතිව දීර්ඝකාලීන වැඩසටහනක් සංවර්ධනය කළේය. මෙහිදී විශේෂයෙන්ම 'සීමාවලින් තොර පුවත්පත් කලාවක්' ඇති කිරීම, ප්‍රජා කණ්ඩායම් දෙකේම පොදු සංස්කෘතික

උරුමයන්ට සහ ස්මාරකයන්ට ගරු කිරීම සහ පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රජා කොටස් දෙකේ ප්‍රයත්න ප්‍රවර්ධනය කිරීම ආදියෙන් මෙම බලාපොරොත්තු සඵල කර ගැනීමට බලාපොරොත්තු වේ (ඇකර්මන් 2000). ප්‍රජා කොටස් දෙක අතර ආතති තත්ත්වය ඉතා තියුණුව පැවති අතර කොසෝවෝහි පවතින යුද්ධයේ ප්‍රතිවිපාක හේතු කොට ගෙන එම තත්ත්වය වඩාත් උග්‍රවිය. ඇත්ත වශයෙන්ම 2000 මැයි /ජුනිවල ඇති වූ සටන් සිවිල් යුද්ධයක් දක්වා ව්‍යාප්ත වීමේ තර්ජනයක් පැවතුණි. කණ්ඩායම්වල අනන්‍යතාව සහ සමාජ තත්ත්වය පිළිගැනීම සම්බන්ධයෙන් යටින් පවතින මතභේද නිරාකරණය වී නොතිබුණි. එසේ වුවද අන්තර් වාර්ගික සන්ධානයක් තවමත් පාර්ලිමේන්තුව තුළ (I පඨය) නිරූපිදිතව පවතී. ප්‍රචණ්ඩ ගැටුමක් මැඩ පවත්වා ගැන්මට මෙය ඉතාමත් තීරණාත්මක සාධකය වශයෙන් සැලකිය හැකිය. මෙය ලියන අවස්ථාවන වන විටත් මෙම ආතති මැසිඩෝනියාව වසාගෙන තිබිය හැකි නමුත් අභ්‍යන්තර සහ බාහිර ක්‍රියාකාරීන් මේතාක් කල් ඵලදායී අන්දමින් එක්ව සැලකිය යුතු ප්‍රමාණයේ ධාරිතාවක් නිර්මාණය කිරීමට ක්‍රියා කර ඇත. මෙය අවම වශයෙන් ඉහළ තලයේ වෙනස්කම්වලට ඉඩකඩ සලසා දීමට ප්‍රයෝජනවත් වනු ඇත.

## 3.3. අභ්‍යාසයේ බලපෑම තක්සේරු කිරීම

මේ ආකාරයේ අභ්‍යාසවලින් ගැටුම කෙරෙහි ඇතිවන සමස්ත බලපෑම කුමක්ද? තවමත් ඒ ගැන යමක් කීම අපහසුය. උදාහරණ වශයෙන් ලෙඩෙරාච්ගේ කෘතියේ (1997) ව්‍යවස්ථිත සාම කොට්ඨාස ගොඩනැගීම පිළිබඳව ලබා ඇති සැලකිය යුතු ප්‍රමාණයේ ජයග්‍රහණ ගැන වාර්තා තිබේ. මෑතකදී සම්පාදනය කරන ලද කෘතිවල ජයග්‍රහණයන් සේ පෙනී යන සිත්ගන්නාසුලු සමහර කතා ඇතුළත් වී තිබේ (ගැටුම් වැළැක්වීම සඳහා යුරෝපා වේදිකාව 1999a,b). කෙසේ වුවද වඩාත් ක්‍රමානුකූල අන්දමින් බලපෑම් තක්සේරු කිරීම පිළිබඳ මුඛ්‍ය විචල්‍ය කරුණු හඳුනා ගැනීම සමහර තුලනාත්මක පර්යේෂණ අධ්‍යයනයන් මගින් ආරම්භ කරන ලද්දේ ඉතා මෑතකදීය. එම අධ්‍යයනයන් සමහරක් වන්නේ ගැටුම් වැළැක්වීම සහ ව්‍යාවර්තනය සඳහා වූ යුරෝපීය වේදිකාව නම් ව්‍යාපාරය මගින් සම්පාදනය කරන ලද "*සාම අභ්‍යාස ප්‍රත්‍යවේක්ෂණය*" සහ "*ගැටුම් මැදිහත්වීම්වලදී ඉගෙන ගත් පාඩම්*" යන කෘති දෙකයි. බර්කොවිච්ගේ පර්යේෂණ (1996) යෝජනා කරන්නේ ගැටුම් කළමනාකරණ ප්‍රවේශ, (බල මූලාශ්‍ර යොදාගැනීම ඇතුළුව) සමථය ලබාදීමේ දී අතිශයින් ඵලදායී වන බවයි. අනික් අතට බොහෝ විට ගැටුම සැබෑ ආකාරයෙන් ව්‍යාවර්තනයකට භාජනය කිරීමට මෙම සමථකරණයන්ට හැකියාවක් නැත. ඒ අනුව දුර්වල කෙටිකාලීන දේශපාලන සමථකරණයන්ට වඩා සම්බන්ධතා සහ ධාරිතා ගොඩනැගීම සඳහා අවශ්‍ය වන දීර්ඝකාලීන වැඩකටයුතු වැදගත් විය හැකිය.

වාර්ගික ගැටුම් අවසන් කිරීම පිළිබඳ සමස්ත සාක්ෂි විශේෂයෙන් ම සහනකාරී වෙයි. යුරෝපයේ, මැද පෙරදිග සහ අප්‍රිකාවේ 1945 සිට සාමකාමීව සමථයට පත් කරන ලද ගැටුම් පිළිබඳව අධ්‍යයනයක දී (ෆෙච් සහ රෝලෝෆ් 2000)කතුවරුන් සොයාගෙන ඇත්තේ වාර්ගිකත්වය,ආගම හෝ ප්‍රාදේශීය ස්වයං පාලනය පදනම් වූ ගැටුම් 121 න් 13 ක් පමණක් සාමාකාමී සාකච්ඡා මගින් (අලාන්ඩ් දූපත්, උතුරු එපිරසය, සාර් සහ දකුණු ටිරෝලය මෙයට අයත් වේ) නිරාකරණය කරන ලද බවයි. 51ක් තීරණයකින්

තොරව පවතී. 8ක් නිරාකරණය කරනු ලැබුවේ බලය යොදවන බවට තර්ජනය කිරීමෙන් හෝ වෙනත් ආකාරයේ බලහත්කාරකම් තුළිනි. 49ක් විසඳනු ලැබුවේ ප්‍රචණ්ඩත්වය උපයෝගී කර ගැනීමෙන්ය. සාමකාමී ප්‍රත්‍යෙක අතුරින් අතිමහත් බහුතරය වූයේ 1991 දී සාමකාමීව වෙන් වී ගිය පැරණි සෝවියට් දේශයේ ජනරජයන්ය. ඇත්ත වශයෙන්ම චෙච්නියා, නගෝනෝ-කරබාහ් සහ වෙනත් ස්ථානවල ප්‍රචණ්ඩ ගැටුම් තිබුණේ වී නමුත් ප්‍රචණ්ඩත්වයකින් තොරව පැරණි සෝවියට් දේශයේ ව්‍යාවර්තිත වාර්ගික ගැටුම් සංඛ්‍යාව පුදුම සහගතය.

ප්‍රයෝජනවත් ක්‍රියා පිළිවෙලක් වන්නේ මෙම සාමකාමී අවස්ථා හඳුනාගෙන ඒවා ප්‍රචණ්ඩත්වය මගහැර කටයුතු කිරීමට හැකි වූ හේතු නිසැකවම අවබෝධ කර ගැනීමයි; එමෙන් ම වාර්ගික සහ අනෙකුත් අභ්‍යන්තර ගැටුම් කළමනාකරණය කළේ හෝ ආමන්ත්‍රණය කළේ කෙසේද යන්නයි. එහෙත් ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම හේතු කොට ගෙන ගැටුම අවසන් වුණ බවට තීරණය කිරීම අවශ්‍ය ප්‍රමාණයට වඩා අවසානය දැකීමේ නොමේරූ දර්ශකයකි. මෙම දර්ශකය පදනම් කරගෙන ගැටුම් ව්‍යාවර්තන පියවර සැලසුම් හෝ තක්සේරු නොකළ යුතුය. මේ සඳහා වඩාත් සියුම්ව සකස් කරන ලද විශේෂිත ප්‍රවේශයක් අවශ්‍ය වේ. සාමය සහ ගැටුම්වල බලපෑම් ඇගැයීම (PCIA) වැනි ක්‍රම පද්ධතිවල සංවර්ධනය කර ඇති දර්ශක එවැනි ප්‍රවේශයක් ඉදිරිපත් කරයි (මෙම වෙළුමෙහි හොෆ්මන්ගේ ලිපිය බලන්න). යම් හෙයකින් ගැටුම් ව්‍යවර්තනය මෙම ලිපියේ මුල් කොටසේ දක්වා ඇති පරිදි පාර්ශවයන්ගේ ඉලක්ක සහ කාලයට වඩා අදාළ කරුණු ආදී වශයෙන් ගැටුම් ව්‍යුහයක වෙනස්වීම් අනුපිළිවෙල අනුව කොටස්වලට බෙදිය හැකි නම්, මැදිහත්වීම්, ගැටුම තුළ විශේෂිත වූ ව්‍යාවර්තනය සමඟ ගැලපීම වඩාත් පහසු විය හැකිය.



ගැටුම් ව්‍යාවර්තනය සඳහා වන ප්‍රයත්නවල බලපෑම ගැටුම් සම්බන්ධ වී සිටින පාර්ශවයන්ට බලපාන කාරණයක් පමණක් ලෙස සැලකිය යුතු නොවේ. එය සම්බන්ධ වී සිටින පුද්ගලයන්ට ද ඍජුවම අදාළ වේ. සියලුම ගැටුම් ව්‍යාවර්තනයන්ට ආවේණික අභියෝග, දුෂ්කරතා, දැඩි අපහසුතා, පසුබෑම් සහ දැඩි ග්‍රහණය ආදියෙන් තේරුම් යන්නේ අප විසින් "ව්‍යාවර්තකයන් ද ව්‍යාවර්තනය කළ යුතු" බවයි. සාම අධ්‍යාපනය වැඩි දියුණු කිරීමට, පුහුණු වැඩසටහන්වල තත්ත්වය නැංවීම සහ ආත්ම ප්‍රත්‍යවේක්ෂණය සහ ආධ්‍යාත්මිකතාව සඳහා අවස්ථාවන් නිර්මාණය කිරීමට සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් කෙරෙහි අපගේ අවධානය යොමු කරන අවස්ථාවේ දී අප විසින් මේ කණ්ඩායම ඇතුළත් කරගත යුතු වේ (කොටුව 8 බලන්න).

**කොටුව 8: ව්‍යාවර්තකයන් ව්‍යාවර්තනය කිරීම සිරිතක් වශයෙන් සිනාසීම**

ලෝකයේ වඩාත්ම කැපී පෙනෙන එක්තරා ගැටුම් ව්‍යාවර්තකයෙක් ගැටුම පිළිබඳ පොත්වල සාමාන්‍යයෙන් දක්නට නොලැබෙන, අතර කොහෙත්ම දක්නට නොමැති එක්තරා ක්‍රමයක් පාවිච්චි කරයි. එය කෙසේ වුවද ප්‍රතිඵලදායී ක්‍රමයකි. එනම් සිනාසීමයි. "හුස්ම ගනිමි, මම මාගේ මනස සහ ශරීරය සන්සුන් කර ගනිමි. හුස්ම පිටකරමි. මම සිනාසෙමි. මෙය පවත්නා මොහොතයි. මෙය එකම මොහොතයි" තිච් න්හත් හන්හ් වියට්නාම ජාතික බෞද්ධ භික්ෂුවකි, කවියෙකි, සාම ක්‍රියාකාරිකයෙකි. ගැටුම් ව්‍යාවර්තනය පිණිස සිනාසීමේ ප්‍රවේශය ගෙනහැර පාන්නා මොහු පමණක් නොවේ. දලයි ලාමා,

ඇඩම් කර්ලි සහ නෙල්සන් මැන්ඩෙලා යන සියල්ලෝ නිසගයෙන්ම සිනාසෙන්නෝය. තිච් න්හත් හන්හ් අපූරු අන්දමින් සිනාසෙන පමණක් නොව සිනාසීමේ න්‍යාය සහ අභ්‍යාසය පිළිබඳ සවිස්තරාත්මක මාර්ගෝපදේශ කෘතියක් ද ඉදිරිපත් කරයි (න්හත් හන්හ් 1987). එම න්‍යාය සහ අභ්‍යාස මුල් බැස ඇත්තේ සම්ප්‍රදායික ප්‍රඥාව සහ පළපුරුද්ද තුළයි. "අප සාමකාමී නම්, අප සතුටින් සිටින්නේ නම්, අපට සිනා සී මලක් මෙන් පිපෙන්නට පුළුවන; අප පවුලේ සැම දෙනාත්, අපගේ මුළු සමාජයේ සැම දෙනාත් අපගේ සාමයෙන් ප්‍රයෝජන අත්පත් කරගන්නවා ඇත." ගැටුම් ව්‍යාවර්තනයට ප්‍රවේශයක් වශයෙන් සිනාසීමේ අදහසට පදනම් වී ඇත්තේ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයයි. සිනාසීමේ අභ්‍යාසය සතිපට්ඨාන භාවනාවේ අංගයක් වන අතර එය අපට මතක් කර දෙන්නේ ගැටුම් ව්‍යාවර්තකයා එම ක්‍රියාවලියේදී තමාම ව්‍යාවර්තනය වීමේ වගකීම භාරගත යුතු බවයි. ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යායය ප්‍රකාශ කරන්නේ සැම දෙයක්ම අවශේෂ සැම දෙයක් කෙරෙහිම බලපෑමක් ඇති කරන බවයි. අභ්‍යන්තර වූ සැම දෙයක්ම අන් සැම දෙයක්ම සමග බද්ධ වී පවතී. මලක් ගත් කල එය අර්ධ වශයෙන් මලකි, එහෙත් එය ඇතුළත හිරු (තෙජෝ) ද වැසි (ආපෝ) ද පෘථිවිය (පඨවි) ද පවතී. මල සෑදී ඇත්තේ මල් නොවන මහාභූතයන්ගෙනි. ඒ ආකාරයෙන්ම අප ආත්මීය භාවය සෑදී ඇත්තේ ආත්මනීය නොවන සංස්කාරවලිනි. වෙනත් දෙයක් තුළ තිබෙන ආත්මීයත්වය අපට ස්පර්ශ කළ හැක වන අයුරින් ම අප තුළ තිබෙන වෙනත් දෙයක් අප විසින්ම ස්පර්ශ කර ගත හැකිය. බෞද්ධ මනෝවිද්‍යාව අනුව අපට මනෝ විඥානයක් සහ ගබඩා කර තබාගත හැකි විඥාන ආයතනයක් ඇත. එම විඥාන ආයතනය තුළ විඥාන බීජ වර්ධනය වේ. ඒවා අපගේ මනෝ විඥානය තුළ රෝපණය වූ විට අපි ඒවාට ජලය ඉසින්නෙමු. එවිට ඒවා වැඩේ. ගැටුමේ දී අපි වෛරය නැමැති බීජයට ජලය ඉසින්නෙමු. අපගේ විඥානායතනය තුළ තිබෙන වෛරය වැඩී ශක්තිමත් වන තෙක් අපි ජලය ඉසින්නෙමු. එවිට එයට අපගේ චේතනා සහ චර්යා පාලනය කළ හැකිය. නමුත් මෙය නොවැළැක්විය හැකි දෙයක් නොවේ. චිත්ත භාවනාව මගින් ද්වේශය, වේදනාව සහ වෛරය, දයාව, ප්‍රීතිය සහ ආදර්ය ලෙස ව්‍යාවර්තනය කළ හැකිය. ගැටුම් ව්‍යාවර්තනය, විඥානායතනය මෙන් වැඩෙන ආකාරය නොදන වුව ද බීජ රැකබලා ගනියි, ජලය යොදයි. මතකය, සම්බන්ධතා සහ ගැටුම් සාමූහිකව විඥනායතනය තුළ තිබෙන බීජයන්ය. සාමූහික ගැටුම් ව්‍යාවර්තනයේ දී අප ගැන සහ අනෙක් අය සමග අපගේ අන්තර් පැවැත්ම ගැන ද ගැඹුරු අවබෝධයක් අවශ්‍ය වේ.



## 4. නිගමනය

මෙම ලිපියෙන් තර්ක කොට ඇත්තේ පසුගිය දශකය තුළ ගැටුම් ව්‍යාවර්තන න්‍යාය සහ අභ්‍යාසය පිළිබඳ කැපී පෙනෙන ගුරුකුලයක් වර්ධනය වීම පිළිබඳවයි. මෙම නව ප්‍රවේශය ගැටුම් කළමනාකරණයෙන් සහ ගැටුම් නිරාකරණයෙන් වෙන්කොට හඳුනාගත හැකි නමුත් ගුරු කුල තුනම ගැටුම් සහ මැදිහත්වීම් පොදු සාම්ප්‍රදායික චින්තනයෙහි කොටස් කරුවෝ වෙති.

ගැටුම් ව්‍යාවර්තනය පෘථුල ප්‍රවේශයකි; එය මානයන් පරාසයක් අමතයි (සූක්ෂම පරිමාණයේ සිට සාර්ව පරිමාණ උස්ගතයන් දක්වා; දේශීය තලයේ සිට ගෝලීය තලය දක්වා; බිම් මට්ටමේ සිට ප්‍රභූ ක්‍රියාකාරකම් දක්වා; කාල පරිමාණ වශයෙන් කෙටිකාලීන සිට දිගුකාලීන දක්වා). එයින් බලාපොරොත්තු වන්නේ ප්‍රතිඵල ලබාගැනීම සඳහා පහසුකම් සැලසීම හෝ සමථකරණ සැපයීම නොව ධාරිතාව වර්ධනය කිරීමට සහ ව්‍යුහාත්මක වෙනසකට සහයෝගය දීමටය. එය පූර්ව ප්‍රචණ්ඩ සහ පශ්චාත් ප්‍රචණ්ඩ අවධිවලදී ගැටුම හා සම්බන්ධවීමට අපේක්ෂා කරයි; එමෙන්ම සාමාන්‍යයෙන් සටන පවතින ස්ථාන ඉක්මවා ඔබ්බට විහිදෙන ප්‍රචණ්ඩ ගැටුමේ හේතු සහ ප්‍රතිඵල සමග සම්බන්ධවීමට ද එය අපේක්ෂා කරයි.

ඉමහත් බලාපොරොත්තු සහිත නිර්දේශාත්මක න්‍යායයන් වර්ධනාත්මක වූ විශ්ලේෂණීය ප්‍රවේශ සමග වඩාත් හොඳින් බද්ධවීමේ අවශ්‍යතාව ගැන මෙම ලිපිය හේතු දක්වයි. ඒ අතරම විශ්ලේෂණාත්මක න්‍යායයන් කාල පරිමාණය සහ අවකාශය අනුව දීර්ඝ කළ යුතුය. සන්දර්භගත ගැටුම ද ඇතුළත් වන පරිදි ගැටුම් න්‍යායය පුළුල් කිරීම හා ඇගැයීම සඳහා න්‍යායාත්මකව දැනුවත් කරන ලද ආකෘතියක් ද ලිපියෙන් යෝජනා කෙරෙයි.

න්‍යායය තුළ ප්‍රශ්න හා හිඩැස් කිහිපයක්ම ඉතිරිව පවතී. ගැටුමක සම්භාව්‍ය පිළිබඳ ලක්ෂණ ප්‍රමාණවත් වශයෙන් ග්‍රහණය කර ගැනීමට ප්‍රමාණවත් තරමින් නිරවද්‍ය වූ ගතික න්‍යායයන් අපට තවමත් නැත. නව ක්‍රියාකාරීන්ගේ සහ නව ප්‍රස්තුත කරුණුවල උද්භවය ද මෙයට ඇතුළත් වේ. බොහෝ න්‍යායයන් අවධානය යොමු කරන්නේ එක්කෝ ගැටුමේ හේතු සහ වර්ධනය ගැනය. නැතහොත් සාමය ගොඩනැගීමේ ධාරිතාවක නිර්මාණය සහ පැවැත්ම ගැනය. එසේ කරන අතර ගැටුම් නිවාරණ සාධක සහ ගැටුමට හේතු අන්‍යෝන්‍ය ව ක්‍රියා කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ප්‍රමාණවත් අයුරින් සංකලනය කිරීමට අපොහොසත් වෙයි. බහුපථ රාජතාන්ත්‍රිකත්වය පිළිගැනීමට කිසියම් ප්‍රමාණයක විවේචනයකින් තොර වූ කැමැත්තක් තිබුණි. එහි දී විවිධ පථ හා සම්බන්ධ ක්‍රියාකාරකම් එකිනෙකට ගැලපෙන්නේ කෙසේද යන්න පිළිබඳව ප්‍රමාණවත් සංකල්පනය කිරීමක් නොකෙරුණි. ගැටුම කෙරෙහි ගැටුම් ව්‍යාවර්තන ක්‍රියාකාරකම්වල බලපෑම පිළිබඳ අප තුළ තවමත් ඇත්තේ අසම්පූර්ණ අවබෝධයකි. ඒ හේතු කොට ගෙන ඒවා ඇගැයීමකට ලක් කිරීම ද අසීරු වී ඇත.

110

ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ මෙහෙයුම් කාර්යභාරය පුළුල්වන විට එය වඩාත් ධෛර්ය හීන කරවන්නක් සේ පෙනිය හැකිය. ඕනෑම අභ්‍යාසකයකුට ව්‍යාපෘතයෙකුට හෝ න්‍යායවාදියෙකුට ක්‍රියාත්මක විය හැක්කේ මෙම අති පුළුල් ක්ෂේත්‍රයේ යම් කොටසක් සම්බන්ධයෙන් පමණි. අපට කළ හැකි එකම දේ වන්නේ හිතට එකඟව එක් කොටසක් බාර ගෙන එය හොඳින් ඉටු කිරීමයි. අපි බීජ පැළකොට ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යායය ඉතිරි කටයුතු ගැන වග කියනු ඇතැයි විශ්වාස කරමු.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම සඳහා


Ackermann, A. 2000. *Making Peace Prevail: Preventing Violent Conflict in Macedonia*, Syracuse: Syracuse University Press.

Anderson, M. 1999. *Do No Harm: How Aid Can Support Peace – or War*, Boulder: Lynne Rienner.

Axelrod, R. 1984. *The Evolution of Cooperation*, New York: Basic Books.

Azar, E. 1990. *The Management of Protracted Social Conflict*, Aldershot: Dartmouth.

Azar, E. and John W. Burton, 1986. *International Conflict Resolution: Theory and Practice*, Boulder: Lynne Rienner and Wheatsheaf.

Bailey, S. 1993. *Peace is a Process*, Quaker Home Service and Woodbrooke College for the Swarthmore Lecture Committee.

Bercovitch, J. (ed.) 1996. *Resolving International Conflicts: The Theory and Practice of Mediation*, Boulder: Lynne Rienner.

Bloomfield, D. 1997. *Peacemaking strategies in Northern Ireland: Building Complementarity in Conflict Management Theory*, Basingstoke: Macmillan.

Bloomfield, D. and Ben Reilly 1998. "The Changing Nature of Conflict and Conflict Management," *in* Peter Harris and Ben Reilly (eds.), op. cit.

Burton, J. 1987. *Resolving deep-rooted conflict: a handbook*, Lanham, Maryland: University Press of America.

Burton, J. and F. Dukes (eds.) 1990. *Conflict: Practices in Management, Settlement and Resolution*, vol 4 of the Conflict Series, London: Macmillan.

Carnegie Commission on Preventing Deadly Conflict 1997. *Preventing Deadly Conflict*, Washington DC: Carnegie Corporation of New York.

Clark, H. 2000. *Civil Resistance in Kosovo*, London: Pluto.Cochrane, F. and Seamus Dunn 2002. *People Power: The Role of the Voluntary and Community Sector in the Northern Ireland Conflict*, Cork: Cork University Press.

Conciliation Resources 2000. *Annual Report 1999*, London: Conciliation Resources (see http://www.c-r.org)

Coogan, T. 1995. *The Troubles: Ireland's Ordeal 1966-1995 and the search for peace*, London: Hutchinson.

Corbin, J. 1994. *Gaza First: the Secret Norway Channel to Peace between Israel and the PLO*, London: Bloomsbury.

Curle, A. 1971. *Making Peace*, London: Tavistock.

Curle, A. 1987. *In the middle: non-official mediation in violent situations*, New York: Berg.

Curle, A. 1996. *Another Way: Positive Responses to Violence*. Oxford: John Carpenter.

De Reuck, A. 1984. "The logic of conflict: its origin, development and resolution," in *Conflict in World Society*, ed. M. Banks, Brighton: Harvester.

Duffield, M. 1997. "Evaluating conflict resolution," in Serbe G, Macrae J. and L Wohlgemuth, *NGOs in Conflict – An Evaluation of International Alert*, Fantoft-Bergen, Norway: Christian Michelsen Institute, 79-112.

European Platform for Conflict Prevention 1999a. *Searching for Peace in Africa: An Overview of Conflict Prevention and Management Activities*. Utrecht: European Centre for Conflict Prevention.

European Platform for Conflict Prevention 1999b. *People Building Peace*, Utrecht: European Centre for Conflict Prevention.

Fisher, R. and Loreleigh Keashly 1991. "The potential complementarity of mediation and consultation within a contingency model of third-party intervention," *Journal of Peace Research*, Vol 28, No. 1, 29-42.

Fitzduff, M. 1999. "Changing History - Peacebuilding in Northern Ireland," in European Centre for Conflict Prevention, *People Building Peace*, Utrecht: European Centre for Conflict Prevention.

Galtung, J. 1969. "Conflict as a way of life," *in* H. Freeman, Progress in Mental Health, London: J. & A. Churchill.

Galtung, J. 1996. *Peace by Peaceful Means*, London: Sage.

Galtung, J. and Carl G. Jacobsen 2000. *Searching for Peace*, London: Pluto.

Glasl, F. 1982. "The Process of Conflict Escalation and Roles of Third-parties," in G.B.Bomers and R.B. Peterson (eds.), *Conflict Management and Industrial Relations*, Boston, The Hague, London: Kluwer Nijhoff.

Harris P. and Ben Reilly (eds.) 1998. *Democracy and Deep-rooted conflict*, Stockholm: Institute for Democracy and Electoral Assistance (IDEA).

Hume, C. 1994. *Ending Mozambique's War*, Washington: United States Institute of Peace.

International Alert 1996. *Resource Pack for Conflict Transformation*, London: International Alert.

Jabri, V. 1996. *Discourses on Violence: Conflict Analysis Reconsidered*, Manchester: Manchester University Press.

Joongman, A. 2000. "Mapping Dimensions of Contemporary Conflicts and Human Rights Violations," *World Conflicts and Human Rights MAP 2000*. PIOOM, Leiden: Leiden University.

Kona, Epokhorr S.1999. *A framework for cross-cultural conflict resolution theory: Prospects for Cultural Contributions from Africa*, Richardson Institute, Lancaster University: Unpublished thesis.

Kriesberg, L. 1998. *Constructive Conflicts: From Escalation to Resolution*. Lanham: Rowman and Littlefield.



Krippendorf, E. 1973. "Peace Research and the Industrial Revolution", *Journal of Peace Research*, Vol 10, 185-201.

Lederach, J.P. 1995. *Preparing for Peace: Conflict Transformation Across Cultures*, New York: Syracuse University Press.

Lederach, J. P. 1997. *Building Peace: Sustainable Reconciliation in Divided Societies*, Washington, D.C.: United States Institute of Peace Press.

Leonhardt, M. 2000. *Conflict Impact Assessment of EU Development Cooperation with ACP Countries: A review of literature and practice*, London: International Alert/Saferworld.

Miall, H., Oliver Ramsbotham, and Tom Wodhouse 1999. *Contemporary Conflict Resolution*, Cambridge: Polity.

Mitchell, C. R. 1981. *The structure of international conflict*. London, Macmillan.

Mitchell, C. R. 2000. *Gestures of Conciliation: Factors Contributing to Successful Olive-Branches*, Basingstoke: Macmillan.

Nhat Hanh, T. 1967. *Lotus in A Sea of Fire*, New York: Fellowship of Reconciliation.

Nhat Hanh, T. 1987. *Being Peace*, Berkeley, CA: Parallax Press.

Pfetsch, F. and Christoph Rohloff 2000. *National and International Conflicts 1945-1995*, London: Routledge.

Phuong, C. N. 1991. "Compassionate Action in the Midst of War," *Karuna*, 11 (Spring).

Ramsbotham, O. and Woodhouse, Tom 1996. *Humanitarian Intervention in Contemporary Conflict*, Cambridge: Polity.

Rapoport, A. 1989. *The Origins of Violence*, New York: Paragon House.

Reychler, L. and Thania Paffenholz 2001. *Peacebuilding: A field guide*, London and Boulder: Lynne Rienner.

Ruane, J and J. Todd, 1996, *The Dynamics of Conflict in Northern Ireland*, Cambridge: Cambridge University Press.

Rupesinghe, K. (ed.) 1995. *Conflict Transformation*, London: Macmillan.
Rupesinghe, K. 1998. *Civil Wars, Civil Peace*, London: Pluto.
Schmid, A. 1997. "Early Warning of Violent Conflicts" in A.Schmid (ed.), *Violent Crime and Conflicts*, Milan: ISPAC (International Scientific and Professional Advisory Council of the UN Crime Prevention and Criminal Justice Programme).
Senghaas, D. 1973. "Conflict Formations in Contemporary International Society," *Journal of Peace Research*, vol.10, 163-184.
Sharp, G. 1973. *The politics of nonviolent action*, (3 vols), Boston: Porter Sargent.
Ury, W. 1999. *Getting to Peace: Transforming Conflict at Home, at Work, and in the World*, New York: Viking.
Vayrynen, R. (ed.) 1991. "To Settle or to Transform? Perspectives on the Resolution of National and International Conflicts," *New Directions in Conflict Theory: Conflict Resolution and Conflict Transformation*. London: Sage, 1-25.
Wehr, P. 1979. *Conflict Regulation*, Boulder, Colorado: Westview.
Wehr, P., Heidi Burgess & Guy Burgess (eds.) 1994. *Justice Without Violence*, Boulder: Lynne Rienner.
Weller, M. et al 2000. *Missed Opportunities of Conflict Prevention in Kosovo: A transatlantic evaluation*, Ebenhausen: Conflict Prevention Network/SWP.